***සැ. යු.* -** *2018.06.14 වැනි දින පළ වූ අංක 2076 දරන ගැසට් පත්‍රයේ II සහ IV (අ) කොටස් පළ නොවීය.*

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,077 - 2018 ජුනි මස 22 වැනි සිකුරාදා - 2018.06.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 950 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 952 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 952 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 ජූලි මස 13 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ජුනි මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*).

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


949 – B 081423 — 403 (2018/06)
A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2018 අංක 537

MOD/DEF/03/02/RET/327.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2018 අප්‍රේල් මස 20 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

රියර් අද්මිරාල් දිමුතු සිරිල් ගුණවර්ධන ආර්ඩබ්පී*, ආර්එස්පී, යූඑස්පී, එන්එස්ඩබ්සී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0316

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

06 - 821/1

---

2018 අංක 538

MOD/DEF/03/02/RET/327.

**ශ්‍රී ලංකා නාවික හමුදාව**

නිත්‍ය නාවික බලකායේ සිට නිත්‍ය නාවික උපසේවයට මාරුකිරීම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2018 අප්‍රේල් මස 20 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායේ සිට නිත්‍ය නාවික උපසේවයට මාරුකිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

රියර් අද්මිරාල් දිමුතු සිරිල් ගුණවර්ධන ආර්ඩබ්පී*, ආර්එස්පී, යූඑස්පී, එන්එස්ඩබ්සී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0316

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

06 - 821/2

---

MOD/DEF/03/02/RET/305.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් අවලංගු කිරීම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2018 ජනවාරි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපතිතුමා විසින් අවලංගු කර ඇත.

කොමාණ්ඩර් (එන්ඩී) අනුර ගාමිණී සුරවීර ආරච්චි, ශ්‍රී ලංනාහ - එන්ආර්එක්ස් 0885

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 මැයි මස 02 වැනි දින,
කොළඹ දී ය.

06 - 822/1

---

MOD/DEF/03/02/RET/305.

**ශ්‍රී ලංකා නාවික හමුදාව**

නිත්‍ය නාවික බලකායේ සිට නිත්‍ය නාවික උපසේවයට මාරුකිරීම අවලංගු කිරීම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2018 ජනවාරි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායේ සිට නිත්‍ය නාවික උපසේවයට මාරුකිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අවලංගු කර ඇත.

කොමාණ්ඩර් (එන්ඩී) අනුර ගාමිණී සුරවීර ආරච්චි, ශ්‍රී ලංනාහ - එන්ආර්එක්ස් 0885

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 මැයි මස 02 වැනි දින,
කොළඹ දී ය.

06 - 822/2

2018 අංක 539

MOD/DEF/03/02/RET/305.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2018 ජනවාරි මස 15 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

කොමාණ්ඩර් (එන්ඩී) අනුර ගාමිණී සුරවීර ආරච්චි, ශ්‍රී ලංනාහ - එන්ආර්එක්ස් 0885.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්‍ෂක අමාත්‍යාංශය.

2018 මැයි මස 02 වැනි දින,
කොළඹ දී ය.

06 - 822/3

---

2018 අංක 540

MOD/DEF/03/02/RET/305.

**ශ්‍රී ලංකා නාවික හමුදාව**

නිත්‍ය නාවික බලකායේ සිට නිත්‍ය නාවික උපසේවයට මාරුකිරීම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2018 ජනවාරි මස 15 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායේ සිට නිත්‍ය නාවික උපසේවයට මාරුකිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

කොමාණ්ඩර් (එන්ඩී) අනුර ගාමිණී සුරවීර ආරච්චි, ශ්‍රී ලංනාහ - එන්ආර්එක්ස් 0885.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්‍ෂක අමාත්‍යාංශය.

2018 මැයි මස 02 වැනි දින,
කොළඹ දී ය.

06 - 822/4

---

2017 අංක 541

MOD/DEF/03/02/8/7/2510.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2018 පෙබරවාරි මස 01 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වි) වශයෙන් :*

ලුතිනන් (වි) සුමිත් අනුරුද්ධික පෙරමුණ, එන්ආර්එල් 2510, ශ්‍රීලංනාහ ;

*2018 මාර්තු මස 09 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සිඉ) වශයෙන් :*

ලුතිනන් (සිඉ) සඳගිරි පතිරන්නැහැලාගේ නලීන් ශ්‍යාමින්ද සඳගිරි, එන්ආර්සී 2639, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්‍ෂක අමාත්‍යාංශය.

2018 මැයි මස 02 වැනි දින,
කොළඹ දී ය.

06 - 823

---

2018 අංක 542

MOD/DEF/03/02/8/7/5568.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වෙච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2017 ජුනි මස 30 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (ස්වේ) වශයෙන් :*

ලුතිනන් (ස්වේ) පුංගිගේ රංග තනුජ පීරිස්, එන්වීඑක්ස් 5568, ශ්‍රීලංස්වේනාහ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්‍ෂක අමාත්‍යාංශය.

2018 මැයි මස 02 වැනි දින,
කොළඹ දී ය.

06 - 819

2018 අංක 543

MOD/DEF/03/02/EX/5454.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
ස්වේච්ඡා නාවික උප සේවයට මාරු කිරීමක්

2018 මැයි මස 08 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා නාවික හමුදා ස්වේච්ඡා නාවික බලකායේ සිට ස්වේච්ඡා නාවික උප සේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් (ස්වේ) එදිරිසිංහ ආරච්චිගේ උදේනි ඕවන් පීරිස්, එන්වීඑක්ස් 5454, ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 මැයි මස 02 වැනි දින,
කොළඹ දී ය.

06 - 820

---

## රජයේ නිවේදන

යොමුව : ED/05/69/01/01/204.

**1961 අංක 08 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනතේ 10 වැනි වගන්තිය යටතේ කරනු ලබන නියෝගය**

බප/කළු/වඩුගොඩ ප්‍රාථමික විද්‍යාලය අවසතු කිරීම

අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් වන මම, 1961 අංක 08 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරික විධිවිධාන) පනතේ 10 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ක්‍රියා කරමින්, අංක 13225 හා 1962.07.23 දිනැති ලංකාණ්ඩුවේ *(අති විශෙෂ)* ගැසට් පත්‍රයේ පළකරන ලද, අංක 1581 දරන පැවරුම් නියෝගයේ විස්තර කොට දක්වා ඇති භූමි ප්‍රමාණයට පමණක් අදාළ වන තාක් දුරට 2018 මැයි මස 28 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කරමි.

අකිල විරාජ් කාරියවසම්,
අධ්‍යාපන අමාත්‍ය.

2018 මැයි මස 28 වැනි දින,
"ඉසුරුපාය",
පැලවත්ත, බත්තරමුල්ල.

06 - 955

---

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.හි (ලියාපදිංචි අංක පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

එගොඩවත්ත හෙට්ටිආරච්චිගේ රනිල් සුමුදු ෆ්‍රැන්සිස්කෝ.
ණය ගිණුම් අංකය : 1689427.

2018 අප්‍රේල් මස 27 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් H. M. C. P. හේරත් විසින් 2014 ජනවාරි මස 21 වැනි දින සහතික කරන ලද අංක 2186 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම එගොඩවත්ත හෙට්ටිආරච්චිගේ රනිල් සුමුදු ෆ්‍රැන්සිස්කෝ ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්කෝටි අසූතුන් ලක්ෂ අනූතුන්දහස් දෙසිය තිස්එකයි ශත අනූ අටක (රු. 18,393,231.98) මුදලක් 2018 මාර්තු මස 13 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් එක්කෝටි අසූතුන් ලක්ෂ අනූතුන්දහස් දෙසිය තිස්එකයි ශත අනූ අට (රු. 18,393,231.98) ක මුදල අයකර ගැනීම සඳහා සහ 2018 මාර්තු මස 14 වැනි දින සිට දේපල විකිණීමේ දිනය දක්වා කාලයට රු. 16,936,569.20 ක මුදල මත 12% ක වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 2186 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛණයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපල සහ පරිශ්‍රය කොළඹ 12, හල්ස්ඩෝෆ් වීදියේ

දෙවන මහලේ අංක 200 දරන ස්ථානයේ පිහිටි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාදින්නාගොඩ 513 B ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අළුත්කුරු කෝරළේ දකුණ අඹතලෙන්පහළ කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොතටුව හි පිහිටි මිල්ලගහවත්ත, දෙල්ගහවත්ත හෙවත් මිල්ලගහවත්ත, පෙළෙන්ගහවත්ත සහ කොස්ගහලියද්ද නැමති ඉඩමට (බලයලත් මිනින්දෝරු K. M. A. H. බණ්ඩාර විසින් 2005 ජූලි මස 30 වැනි දින මැන සාදන ලද අංක 2024A දරන පිඹුරේ ලොට් 1 සහ 2 අනු බෙදීමකින් ඒකාබද්ධ වේ) බලයලත් මිනින්දෝරු K. M. A. H. බණ්ඩාර විසින් 2005 සැප්තැම්බර් මස 12 වැනි දින මැන සාදන ලද අංක 2066A දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 30 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන්, උතුරට : ලොට් 29 න් ද, නැගෙනහිරට : ලොට් 33 (අඩි 23 පළල වෙන්කරන ලද පාර) න් ද, දකුණට : ලොට් 31 න් ද සහ බස්නාහිරට : ලොට් 25 න් ද මායිම් වූ එකී අංක 2066A දරන පිඹුර ප්‍රකාරව පර්චස් එකොළහයි දශම දෙකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 11.2) හෙවත් හෙක්ටයාර් 0.0283 ක විශාලත්වයෙන් යුක්ත වූ ඉඩම සමග පදිංචි ගෙවල්, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි අනෙකුත් සියලු දේත් සමග වන මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ B 995/66 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත දැක්වෙන පාරක් සඳහා වෙන්කරන ලද බිම් කොටස් මතින් ගමන් කිරීමේ ප්‍රවේශ අයිතිය ද සමග වේ.

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාදින්නාගොඩ 513B ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, අළුත්කුරු කෝරළේ දකුණ, අඹතලෙන්පහළ කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොතටුව හි පිහිටි මිල්ලගහවත්ත, දෙල්ගහවත්ත හෙවත් මිල්ලගහවත්ත, පෙළෙන්ගහවත්ත සහ කොස්ගහලියද්ද නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු K. M. A. H. බණ්ඩාර විසින් 2005 සැප්තැම්බර් මස 12 වැනි දින මැන සාදන ලද අංක 2066A දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 13 (අඩි 30ක් පළල වෙන්කරන ලද පාර) වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන්, උතුරට : ලොට් 20, 6 සහ 25 න් ද, නැගෙනහිරට : ලොට් 5, 26 (අඩි 20 පළල වෙන්කරන ලද පාර), 25, 34 (අඩි 20 පළල වෙන්කරන ලද පාර), 23, 24, 22 සහ 21 න් ද, දකුණට : ලොට් 25, 24 සහ D. A. පලිහක්කාරගේ සහ අනිකුත් අයගේ පෙළෙන්ගහවත්තෙන් ද සහ බස්නාහිරට : පාර සහ ලොට් 20, 19, 18, 17, 16, 15, 14, 12, 11, 10, 9, 8 සහ 7 න් ද මායිම් වූ එකී අංක 2066A දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් විසිපහයි දශම දෙකයි පහ (අ. 0, රූ. 1, පර්. 25.25) හෙවත් හෙක්ටයාර් 0.1650 ක විශාලත්වයෙන් යුක්ත වන මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව B 991/245 යටතේ ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාදින්නාගොඩ 513B ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, අළුත්කුරු කෝරළේ දකුණ, අඹතලෙන්පහළ කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොතටුව හි පිහිටි මිල්ලගහවත්ත, දෙල්ගහවත්ත හෙවත් මිල්ලගහවත්ත, පෙළෙන්ගහවත්ත සහ කොස්ගහලියද්ද නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු K. M. A. H. බණ්ඩාර විසින් 2005 සැප්තැම්බර් මස 12 වැනි දින මැන සාදන ලද අංක 2066A දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 26 (අඩි 20ක් පළල වෙන්කරන ලද පාර) වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන්, උතුරට : ලොට් 5 න් ද, නැගෙනහිරට : ලොට් 33 (අඩි 20 පළල වෙන්කරන ලද පාර) න් ද, දකුණට : ලොට් 27 සහ බස්නාහිරට : ලොට් 13 (අඩි 30 පළල වෙන්කරන ලද පාර) න් ද මායිම් වූ එකී අංක 2066A දරන පිඹුර ප්‍රකාරව පර්චස් හයයි දශම තුනයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 6.30) හෙවත් හෙක්ටයාර් 0.0159 ක විශාලත්වයෙන් යුක්ත වූ මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව B 983/224 යටතේ ලියාපදිංචි කර ඇත.

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, මාදින්නාගොඩ 513B ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, අළුත්කුරු කෝරළේ දකුණ, අඹතලෙන්පහළ කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොතටුව හි පිහිටි මිල්ලගහවත්ත, දෙල්ගහවත්ත හෙවත් මිල්ලගහවත්ත, පෙළෙන්ගහවත්ත සහ කොස්ගහලියද්ද නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු K. M. A. H. බණ්ඩාර විසින් 2005 සැප්තැම්බර් මස 12 වැනි දින මැන සාදන ලද අංක 2066A දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 33 (අඩි 23ක් පළල වෙන්කරන ලද පාර) වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන්, උතුරට : වෙන්කරන ලද ඇළෙන් ද, නැගෙනහිරට : වෙන්කරන ලද ඇළෙන් ද, දකුණට : ලොට් 34 (අඩි 20 ක් පළල වෙන්කරන ලද පාර) න් ද සහ බස්නාහිරට : ලොට් 32, 31, 30, 29, 28, 27, 26 (අඩි 20 ක් පළල වෙන්කරන ලද පාර) 5, 4, 3, 2 සහ 1 න් ද මායිම් වූ එකී අංක 2066A දරන පිඹුර ප්‍රකාරව පර්චස් තිස් හතයි දශම හතයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 37.70) හෙවත් හෙක්ටයාර් 0.0954 ක විශාලත්වයෙන් යුක්ත වූ මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව B 983/225 යටතේ ලියාපදිංචි කර ඇත.

4. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාදින්නාගොඩ 513B ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, අළුත්කුරු කෝරළේ දකුණ, අඹතලෙන්පහළ කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොතටුව හි පිහිටි මිල්ලගහවත්ත, දෙල්ගහවත්ත හෙවත් මිල්ලගහවත්ත, පෙළෙන්ගහවත්ත සහ කොස්ගහලියද්ද නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු K. M. A. H. බණ්ඩාර විසින් 2005 සැප්තැම්බර් මස 12 වැනි දින මැන සාදන ලද අංක 2066A දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 34 (අඩි 20ක් පළල වෙන්කරන ලද පාර) වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන්, උතුරට : ලොට් 32 සහ 33 (අඩි 23 ක් පළල වෙන්කරන ලද පාර), නැගෙනහිරට : වෙන්කරන ලද ඇළ, ලොට් 35, 36 සහ 37 න් ද, දකුණට : අංක 8259 දරන පිඹුරේ ලොට් A හි කොටසක්, මෙහි ලොට් 35, 37 සහ 21 න් ද සහ බස්නාහිරට : ලොට් 21, 22, 23, 24 සහ 13 (අඩි 30 පළල වෙන්කරන ලද පාර) මායිම් වූ එකී අංක 2066A දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහඅටයි දශම අටයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්.18.80)

හෙවත් හෙක්ටයාර් 0.0476 ක විශාලත්වයෙන් යුක්ත වන මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව B 1052/113 යටතේ ලියාපදිංචි කර ඇත.

රංජනි ගමගේ මිය,
සමාගම් ලේකම්.

2018 අප්‍රේල් මස 27 වැනි දින.

06 - 873

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. (ලියාපදිංචි අංකය පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

උඩවත්ත රංජිත් උඩවත්ත.
ණය ගිණුම් අංක : 1774626 සහ 2039699.

2018 පෙබරවාරි මස 23 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් D. M. B. C. ගුණතිලක විසින් 2006 ජූලි මස 05 වැනි දින සහතික කරන ලද අංක 3460, 2008 අප්‍රේල් මස 28 වැනි දින සහතික කරන ලද අංක 4213, 2010 පෙබරවාරි මස 15 වැනි දින සහතික කරන ලද අංක 4827, 2011 අගෝස්තු මස 01 වැනි දින සහතික කරන ලද අංක 5360 සහ 2014 අගෝස්තු මස 04 වැනි දින සහතික කරන ලද අංක 5985 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සීලොන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ ද බැඳුම්කරයන් (මෙහි පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති දේපළ) යටතේ අයවිය යුතු මුදල් ගෙවීම උඩවත්ත රංජිත් උඩවත්ත ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්ද,

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් D. M. B. C. ගුණතිලක විසින් 2012 මාර්තු මස 09 වැනි දින සහතික කරන ලද අංක 5545, 2013 අගෝස්තු මස 02 වැනි දින සහතික කරන ලද අංක 5813, 2014 අගෝස්තු 04 වැනි දින සහතික කරන ලද අංක 5987 සහ 2016 නොවැම්බර් මස 07 වැනි දින සහතික කරන ලද අංක 6638 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සීලොන් පී.එල්.සී. හි නමට ලියන ලද්දා වූ ද බැඳුම්කරයන් (මෙහි දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති දේපළ) යටතේ අයවිය යුතු මුදල් ගෙවීම උඩවත්ත රංජිත් උඩවත්ත ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද,

එකී බැඳුම්කර යටතේ රුපියල් අනූ එක්ලක්ෂ හතලිස් පන්දහස් තුන්සිය දහසයක (රු. 9,145,316.00) මුදලක් 2017 නොවැම්බර් මස 23 වැනි දින වන විට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රුපියල් අනූ එක්ලක්ෂ හතලිස් පන්දහස් තුන්සිය දහසයක (රු. 9,145,316.00) මුදල අයකර ගැනීම සඳහා සහ 2017 නොවැම්බර් මස 24 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 2,900,000.00 ක මුදල මත 16%ක වැඩිදුර වාර්ෂික පොළිය සහ රු. 5,250,000.00 ක මුදල මත 16%ක සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුලුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 3460, 4213, 4827, 5360, 5985, 5545, 5813, 5897 සහ 6638 දරන බැඳුම්රකයන් යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී.එල්.සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි පළවන සහ දෙවන උපලේඛනවල සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍ර කොළඹ 12, හල්ෆ්ඩොප් වීදියේ, අංක 200 හි 2 වැනි මහලේ ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥාලත් වෙන්දේසිකරු L. B. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් පී.එල්.සී. හි අධ්‍යක්‍ෂක මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

#### පළවන උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, මැද කෝරළේ හෙළ උඩ පළාතේ, බලංගොඩ නගර සභාවේ බලංගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ බලංගොඩ ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ වතුකරගොඩ හි පිහිටි වෙරළුකැටිය මූකළාන නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු A. රත්නම් විසින් 1991 අගෝස්තු මස 17 වැනි දින මැන සාදන ලද අංක 2737 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් D වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන්, උතුරට : ලොට් 82 න් ද, නැගෙනහිරට : ඉහත සඳහන් අංක 2737 දරන පිඹුරේ ලොට් E න් ද, දකුණට : ඉහත සඳහන් අංක 2737 දරන පිඹුරේ ලොට් H න් ද සහ බස්නාහිරට : ඉහත සඳහන් අංක 2737 දරන පිඹුරේ ලොට් A න් ද, මායිම් වූ පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) විශාලත්වයෙන් වූ ඉඩම සමග එහි පිහිටි සියලුදේත් සමග වන මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව E 242/183 යටතේ ලියාපදිංචි කර ඇත.

#### දෙවන උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, මැද කෝරළේ හෙළ උඩ පත්තුවේ, බලංගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ බලංගොඩ ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ වතුකරගොඩ හි පිහිටි තැනවත්තහේන හෙවත් තැන්නවත්තහේන සහ එගොඩවත්තහේන හෙවත් ගොඩවත්තහේන නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු R. M. කළුබණ්ඩා විසින් 1985 ජූලි මස 03 වැනි දින මැන සාදන ලද අංක

168 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 02 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම්, වශයෙන් උතුරට : පාරෙන් ද, නැගෙනහිරට : අංක 477 දරන පිඹුරේ ලොට් 164 පැළඉණි වැටෙන් ද සහ ඉහත සඳහන් අංක 168 දරන පිඹුරේ ලොට් 03 න් ද, දකුණට : ඉහත සඳහන් අංක 168 දරන පිඹුරේ ලොට් 05 සහ 04 න් ද සහ බස්නාහිරට : අංක 168 දරන පිඹුරේ ලොට් 01 සහ 04 න් ද මායිම් වූ පර්චස් දහඅටයි දශම අටක (අ. 0, රූ. 0, පර්. 18.8) විශාලත්වයෙන් වූ ඉඩම සමග එහි පිහිටි සියලුදේත් සමග වන මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව E 242/196 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් ඉඩම මෑතක දී කළ මැනීමකින් පසු පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

ඉහත සඳහන් වතුකරගොඩ හි පිහිටි තැනවත්තහේන හෙවත් තැන්නවත්තහේන සහ එගොඩවත්තහේන හෙවත් ගොඩවත්තහේන නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු E. T. P. පෙරේරා විසින් 2008 ජුනි මස 30 වැනි දින මැන සාදන ලද අංක 3090 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : පාරෙන් ද (යුසි), නැගෙනහිරට : එෆ්. වී. පී. 477 දරන පිඹුරේ ලොට් 163 සහ බලයලත් මිනින්දෝරු R. M. කළුබණ්ඩා විසින් මැන සාදන ලද අංක 168 දරන පිඹුරේ ලොට් 03 න් ද, දකුණට : බලයලත් මිනින්දෝරු R. M. කළුබණ්ඩා විසින් මැන සාදන ලද අංක 168 දරන පිඹුරේ ලොට් 05 සහ 04 න් ද සහ බස්නාහිරට : අඩි පාරෙන් ද මායිම් වූ පර්චස් විස්සයි දශම දෙකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 20.20) හෙවත් (හෙක්ටයාර් 0.05114) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුදේත් සමග වේ.

රංජනී ගමගේ මිය,<br>සමාගම් ලේකම්.

2018 පෙබරවාරි මස 23 වැනි දින.

06 - 874

---

**අමානා බැන්ක් පීඑල්සී (පී.බී. 3816 පී.කිව්.) - ඔඩ්ඩමාවඩි ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ අමානා බැන්ක් ලිමිටඩ් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මුතිය.

CIF අංකය : 00090073.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ පහත දැක්වෙන පරිදි විශේෂයෙන්ම සහ ඒකමතිකව යෝජනා සම්මත කරනු ලැබූ බව 2018 පෙබරවාරි මස 17 වැනි දින පවත්වන ලද ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අමානා බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ.

(2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද බැංකු සමාගමක් වන ලියාපදිංචි අංක PB3618PQ දරන සහ කලින් අමානා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හඳුන්වනු ලැබූ) අමානා බැන්ක් පීඑල්සී වෙනුවෙන් මඩකළපුව ප්‍රසිද්ධ නොතාරිස් එම්.බී.එම්. හුසේන් විසින් සහතික කරන ලද 2013.05.13 වැනි දින අංක 9126 දරන උකස් බැඳුම්කරය මත, 2014.09.22 වැනි දින අංක 9513 දරන උකස් බැඳුම්කරය මත, 2014.09.22 වැනි දින අංක 9517 දරන උකස් බැඳුම්කරය මත, 2014.09.22 වැනි දින අංක 9517 දරන උකස් බැඳුම්කරය මත සහ 2015.10.23 වැනි දින අංක 9796 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම බන්ධනදායින් යනුවෙන් හඳුන්වනු ලබන "නාගුර් ලෙබ්බෙ හයිඩර් අලි" සහ "හයිඩර් අලි මෙහොමඩ් මුනාස්" යන අය විසින් පැහැරහැර ඇති හෙයින් ද; එකී උකස් බැඳුම්කර යටතේ 2018 ජනවාරි මස 29 වැනි දින වන විට දැනට අමානා බැන්ක් ලිමිටඩ් වෙත රුපියල් මිලියන හැට එකයි එක් ලක්ෂ හත්දහස් හයසිය හැත්තෑ හතරයි ශත අටක් වූ (රු. 61,107,674.08) මුදලක් ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, අනතුරුව කිසියම් ගෙවීමක් (සිදුකර ඇත්නම්) එම ගෙවීම අඩු කිරීමෙන් පසුව දරන ලද ප්‍රචාරක පිරිවැය සහ වෙනත් ගාස්තු සමගින් 2018 ජනවාරි මස 29 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් සියයට දාසයක් වූ (16%) අනුපාතිකයන් ලාභ/ලාභාංශ/කුලී මුදල් සමගින් එකී රු. 61,107,674.08 වූ මුදල අයකර ගැනීම සඳහා; එකී අංක 9126,9513,9515,9517 සහ 9796 දරන උකස් බැඳුම්කර මගින් අමානා බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද සහ මෙහි උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තර කරන ලද දේපල වරලත් වෙන්දේසිකාර සහ උසාවි කොමසාරිස් අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ අමානා බැන්ක් ලිමිටඩ් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මතකර සිටිනු ලැබේ.

**උපලේඛනය**

**1 වන දේපළ**

නැගෙනහිර පළාතේ, මඩකළපුව දිස්ත්‍රික්කයේ, කඩදාසි කම්හල පාර, කවතාමුනෙයි 210B ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ, ඔඩ්ඩමාවඩි ප්‍රාදේශීය සභා සීමාව තුළ, බටහිර ඔඩ්ඩමාවඩි කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇත්තා වූ ද, උතුරේ සිට දකුණ දක්වා බඹ 11ක් සහ නැගෙනහිර සිට බටහිර දක්වා බඹ 100ක් වූ ප්‍රමාණයකින් යුතු බෙදා වෙන්කළ බටහිර ඉඩම් කොටසින් බෙදා වෙන්කළ ප්‍රමාණයෙන් අක්කර දෙකක් වූ ද, (අ. 02, රූ. 0, පර්. 0) උතුරට : තහිරා යන අයගේ ඉඩම ද, නැගෙනහිරට : එස්. එච්. කාතිසවුම්මා යන අයට අයත් ඉඩමේ ඉතිරි කොටස ද, දකුණට : මුස්තාපා ලෙබ්බේ අහමඩ් යන අයගේ ඉඩම ද, බටහිරට : කඩදාසි කම්හල පාර ද යන මායිම් තුළ පිහිටි ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස වේ.

මෙයට එහි අන්තර්ගත යන්ත්‍රෝපකරණ සහ උපකරණ ඇතුලු සියලු ස්ථිර ගොඩනැගිලි තුන ඇතුළත්වන අතර එම යන්ත්‍රෝපරකණ පිළිබඳ විස්තර "A" ලෙස ලකුණු කරන ලද ඇමුණුමේ නිශ්චිතව දක්වා ඇත.

බලයලත් මිනින්දෝරු කේ. කමලනාදන් විසින් සකස් කරන ලද 2013.03.26 වැනි දින KK/BT/2013/249 දරන මිනින්දෝරු පිඹුරට අනුව, ඉහත උපලේඛනයේ විස්තරකර ඇති ඉඩම පහත පරිදි ද විස්තර වේ. එනම්,

නැගෙනහිර පළාතේ, මඩකළපුව දිස්ත්‍රික්කයේ, බටහිර කෝරළේ පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බටහිර කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව තුළ තවතාමුනෙයි ග්‍රාමයේ කඩදාසි කම්හල පාරේ පිහිටා ඇත්තා වූ ද, උතුරට : දැනට තහිරා විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද, නැගෙනහිරට : එස්. එච්. කතීජා උම්මා විසින් හිමිකම් කියනු ලබන ගෙවත්ත ද, දකුණට : දැනට එම්. අහමෙතු විසින් හිමිකම් කියනු ලබන ගෙවත්ත ද, බටහිරට : කඩදාසි කම්හල පාර ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද ප්‍රමාණයෙන් රූඩ් 03, පර්චස් 17.68ක් වූ බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස වේ.

"අ" ඇමුණුම

| *යොමු අංකය* | *යන්ත්‍රයේ නම* | *නිෂ්පාදිත රට/මාදිලිය/ ස්වභාවය* | *අනුක්‍රමික අංකය* | *ධාරිතාව* | *නිෂ්පාදන වර්ෂය* | *අලුත්/ පාවිච්චි කළ* | *ගැනුම් මිළ (ශ්‍රී ලංකා රුපියල්)* |
|---|---|---|---|---|---|---|---|
| 1 | ඔසවන 3 සහ 10HP, 5HP, 3HP මෝටර් සහිත වියලනය (චීන) | ශ්‍රී ලංකා | - | කි.ග්‍රෑ. 15,000 | 2012 | අලුත් | 3,700,000.00 |
| 2 | වී බහාලුම් ටැංකිය | ශ්‍රී ලංකා | - | කි.ග්‍රෑ. 15,000 | 2012 | අලුත් | 350,000.00 |
| 3 | 3HP මෝටරයක් සහිත බ්ලෝවරය (චීන) | ශ්‍රී ලංකා | - | - | 2012 | අලුත් | 50,000.00 |
| 4 | 3HP මෝටරයක් සහිත හුමාලකය සහ බ්ලෝවරය (චීන) | ඇ.එ.ජ | - | ලීටර් 3,000 | නොදනී | 2012 පාවිච්චිකළ | 2,000,000.00 |
| 5 | 5HP මෝටරයක් සහිත සහල්වල ගල් ඉවත් කිරීමේ යන්ත්‍රය (චීන) | ශ්‍රී ලංකා | - | - | 2012 | අලුත් | 75,000.00 |
| 6 | 2x10HP මෝටරයක් සහිත සහල් පෙනේල යන්ත්‍රය (චීන) | චීන | 179 | පැයට 2T/3T | 2012 | අලුත් | එකක් 410,000.00 |
| 7 | 7HP මෝටරයක් සහිත සහල් වෙන් කිරීමේ යන්ත්‍රය (චීන) | චීන | 122314 | පැයට 2T/3T | 2012 | අලුත් | 590,000.00 |

| යොමු අංකය | යන්ත්‍රයේ නම | නිෂ්පාදිත රට/මාදිලිය ස්වභාවය | අනුක්‍රමික අංකය | ධාරිතාව | නිෂ්පාදන වර්ෂය | අලුත්/ පාවිච්චි කළ | ගැනුම් මිළ (ශ්‍රී ලංකා රුපියල්) |
|---|---|---|---|---|---|---|---|
| 8 | 40HP මෝටරයක් සහිත ජෙට් පොලිෂර් යන්ත්‍රය (චීන) | ජපන් | - | පැයට 2T/3T | 2005 | අලුත් | 75,000.00 |
| 9 | 3HP මෝටරයක් සහිත හුලං කිරීමේ යන්ත්‍රය (චීන) | ශ්‍රී ලංකා | - | | 2009 | අලුත් | 40,000.00 |
| 10 | 5HP මෝටරයක් සහිත සහල්වල ගල් ඉවත් කිරීමේසහිත යන්ත්‍රය (චීන) | චීන | - | | 2012 | අලුත් | 440,000.00 |
| 11 | ප්‍රමාණ 3ක් සහිත සහල් ගබඩා ටැංකිය | ශ්‍රීලංකා | - | එකක් කි.ග්‍ර. 20,000 | 2012 | අලුත් | 950,000.00 (3ක්) |
| 12 | 50HP මෝටරයක් සහිත සිල්කි පොලිෂර් යන්ත්‍රය (චීන) | චීන EM 16 | AP 120 5H 096 | පැයට 2T/3T | 2012 | අලුත් | 1,420,000.00 |
| 13 | 7HP මෝටරයක් සහිත සහල් සිසිල් කිරීමේ යන්ත්‍රය (චීන) | චීන | 4724A | පැයට 2T/3T | 2012 | අලුත් | 465,000.00 |
| 14 | වර්ණ තේරීම් යන්ත්‍රය | ඉන්දියා තැඹිලි වර්ණ | ORO 81- 2213 -3KVA | පැයට 2T/3T | 2012 | අලුත් | 4,900,000.00 |
| 15 | 7HP මෝටරයක් සහිත සහල් වර්ග කිරීමේ යන්ත්‍රය (චීන) | චීන | - | පැයට 2T/3T | 2012 | අලුත් | 375, 000.00 |
| 16 | ඔසවනයන් | | | | | | |
| | 3 ප්‍රමාණයක් ඇති HP7 මෝටරයක් (චීන) සහිත අඩි 24 ඔසවනයන් | ශ්‍රී ලංකා | - | - | 2012 | අලුත් | එක් අඩියක් 5,500. 00 |
| | 13 ප්‍රමාණයක් ඇති 7HP මෝටරයක් (චීන) සහිත අඩි 15 ඔසවනයන් | ශ්‍රී ලංකා | - | - | 2012 | අලුත් | එක් අඩියක් 5,500.00 |

**2 වන දේපළ**

ප්‍රමාණයෙන් උතුරේ සිට දකුණ දක්වා : බඹ 10යි අඩි 2ක් ද, නැගෙනහිර සිට බටහිර දක්වා බඹ 12 ක් ද වූ නැගෙනහිර පළාතේ මඩකළපුව දිස්ත්‍රික්කයේ, මධ්‍යම කෝරළේ පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වාලච්චනේ කෝරලේ පත්තුව, ප්‍රාදේශීය සභා සීමාව තුළ 206C ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බිරන්තුරෙයිචෙනායි දකුණ : බිරන්තුරෙයිචෙනායි ග්‍රාමයේ හියුනා පල්ලිය පාර පිහිටා ඇත්තාවූ ද,

උතුරට : සීනි මොහොමඩ් ෆරීනා යන අයට ඉඩම ද, නැගෙනහිරට : මොහොමඩ් සරිෆු මුස්තාපා යන අයගේ ඉඩම ද, දකුණට : පටුමග ද, බටහිරට : මාර්ගය ද යන මායිම් තුළ පිහිටි ඉඩම් කොටස වේ. මේ සඳහා එම ඉඩමේ අන්තර්ගත සියලු කොටස්ද ඇතුළත් වේ.

ඉහත කී ඉඩම බලයලත් මිනින්දෝරු ඒ. ඊ. කේ. තිස්සවීරසිංහ විසින් සාදන ලද 2014 ජුනි මස 18 වැනි දින අංක 587/2014 දරන පිඹුරේ පහත දැක්වෙන පරිදි වර්තමානයේදී විස්තර කර ඇත; එනම්

ප්‍රමාණයෙන් පර්චස් 15.46ක්ද වූ ද, නැගෙනහිර පළාතේ, මඩකළපුව දිස්ත්‍රික්කයේ මධ්‍යම කෝරලේ පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔඩ්ඩමාවඩි ග්‍රාමයේ කෝරලේ පත්තුව ප්‍රාදේශීය සභා සීමාව තුළ හියුදා පාරේ පිහිටා ඇත්තාවූ ද, උතුරට : සීනි මොහොමඩ් ෆරීනා යන අයගේ දේපළ ද, නැගෙනහිරට : මොහොමඩ් සරිෆු මුස්තාපා යන අයගේ දේපළ ද, දකුණට : පාරද, බටහිරට : මාර්ගය ද යන මායිම් තුළ පිහිටි බෙදා වෙන්කළ ඉඩම් කොටස වේ. මේ සඳහා එහි අන්තර්ගත සියලු දේද ඇතුළත් වේ.

**3 වන දේපළ**

උතුරේ සිට දකුණ දක්වා බඹ 6 1/2 ක් ද, නැගෙනහිර සිට බටහිර දක්වා බඹ 22 1/2 ක් ද, ප්‍රමාණයෙන් යුක්තවූ ද, නැගෙනහිර පළාතේ, මඩකළපුව දිස්ත්‍රික්කයේ බටහිර කෝරලේ පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඔඩ්ඩමාවඩි ප්‍රාදේශීය සභා සීමාව තුළ ඔඩ්ඩමාවඩි - 01, අංක 208B ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඔඩ්ඩමාවඩි ග්‍රාමයේ, කේ. පී. හාජි පාරේ පිහිටා ඇත්තාවූ ද ලොට් අංක 3521 දරන කොටසේ බටහිර පැත්තේ පිහිටි දකුණු අර්ධ කොටස යනුවෙන් හඳුන්වනු ලබන, උතුරට : වෛද්‍ය ලාසාඩීන්ට අයත් ඉඩම ද, නැගෙනහිරට : එස්. අයි. සර්මිලා යන අයට අයත් ඉඩම ද, දකුණට : පිළිවෙලින් එම්. අයි. හයාතු බිවි, ඒ. එල්. සිත්ති හබීබා යන අයට අයත් ඉඩම් ද, බටහිරට : කේ. පී. හාජි පාරද යන මායිම් තුළ පිහිටා ඇත්තාවූ ද බිම් කොටස සහ එහි අන්තර්ගත වෙනත් සියලු දේද වේ.

ඉහත උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම බලයලත් මිනින්දෝරු ඒ. එම්. තජියුදීන් විසින් සාදන ලද 2014.08.23 වැනි දින අංක AMN/14KPW/4247 දරන මිනින්දෝරු පිඹුරට අනුව පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත.

ප්‍රමාණයෙන් පර්චස් දාහතයි දශම හතයි පහක් (17.75පර්.) වූ නැගෙනහිර පළාතේ, මඩකළපුව දිස්ත්‍රික්කයේ, බටහිර කෝරලේ පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර කෝරලේ පත්තු ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 01 කොට්ඨාසයේ ඔඩ්ඩමාවඩි ග්‍රාමයේ කේ. පී. හාජියාර් පාර යන ස්ථානයේ පිහිටා ඇත්තාවූ ද, උතුරට : වෛද්‍ය ලසාඩීන් යන අයගේ දේපළ ද, නැගෙනහිරට : එස්. අයි. සර්මිලා යන අයගේ දේපළ ද, දකුණට : ඒ. එල්. එස්. හබීබා සහ එම්. එල්. හයාතු බිවි යන අයගේ දේපළ ද, බටහිරට : කේ. පී. හාජියාර් පාර ද යන මායිම් තුළ පිහිටි බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ තුළ වූ වෙනත් සියලු දේද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

රිසා ඉස්මෙයිල්,
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ - ප්‍රතිකර්ම ඒකකය.

06 - 880

---

**පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී - දඹුල්ල ශාඛාව**

1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගණුදෙනුකරුවන්ගේ නම් : ඇන්තනී බදුගේ ප්‍රදීප් බිෂ්වජිත් සිල්වා සහ නාරන්ගොඩ රාළලාගේ ප්‍රියංගා දිල්රුක්ෂි

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් වර්ෂ 2017.10.25 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම්, ඇන්තනී බදුගේ ප්‍රදීප් බිෂ්වජිත් සිල්වා බන්ධනදායී උකස්කරු වශයෙන් ද නාරන්ගොඩ රළලාගේ ප්‍රියංගා දිල්රුක්ෂි යන අය බන්ධනදායී වශයෙන් ද ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ආර්. එල්. සී. රණසිංහ විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2014.09.22 දිනැති අංක 545 දරන උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීහ පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 545 දරන උකස් බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දින තෙක් වර්ෂ 2017.10.01 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් පනස් අට ලක්ෂ අනූ දහස් තුන් සිය තිස් හයයි ශත අනූ හතර (රු. 5,890,336,94) ක මුදල සහ වර්ෂ 2017.10.02 වැනි දින සිට රු. 5,568,669.87 ක මුදල මත වාර්ෂිකව 18% බැගින් පොලිය

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

එකී අංක 545 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් පනස් අට ලක්ෂ අනූ දහස් තුන් සිය තිස් හයයි ශත අනූ හතර (රු. 5,890,336.94) ක මුදල ඉහත කී දිනයේ සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද ගාස්තු ද වෂී 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ඇන්තනී බඳුගේ ප්‍රදීප් බිෂ්වජිත් සිල්වා සහ නාරන්ගොඩ රාළලාගේ ප්‍රියංගා දිල්රුක්ෂි යන අයවලුන් විසින් බැකුව වෙත උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, මාවිල්මඩ, දුටුගැමුණු මාවත, අංක 369/1 දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය වෙත එකී වෂී 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

### ඉහත සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (දෙල්කඳ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ) සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව නගර සභා සීමාව තුළ, වෝඩ් අංක 15, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මඩපාත 567 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මඩපාත ග්‍රාමයේ පිහිටා ඇති, මඩපාත පාරේ, වරිපනම් අංක 894/32 දරන "මහවත්තේ කුරුඳුවත්ත, මොරගහවත්ත සහ දැනට විජේහේන එස්ටේට් (කොටසක්)" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට, බලයලත් මානක ටී. ඩී. කේ. ආර්. පී. පාතේගම විසින් මැන සකසන ලද වර්ෂ 2014.07.26 දිනැති අංක 4525 දරන පිඹුරෙහි (බලයලත් මානක ඩී. ඩී. හෙට්ටිගේ විසින් මැන සාදන ලද වර්ෂ 1991.04.29 දිනැති අංක 2621 දරන පිඹුරේ ලොට් 3 වශයෙන් බෙදා වෙන් කර දක්වා ඇති ඉඩම නැවත මැනීමකි.) ලොට් 3ඒ යනුවෙන් නිරූපිත බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : මෙම ඉඩමේම ඉතිරි කොටස සහ අංක 2621 දරන පිඹුරේ ලොට් 2 ද, නැගෙනහිරට : අංක 2621 දරන පිඹුරේ ලොට් 2 සහ 13 ද, දකුණට : අංක 2621 දරන පිඹුරේ ලොට් 13 (අඩි 22 ක් පළල පාරක් සහ කාණුව සඳහා වෙන් කරන ලදී.) සහ ලොට් 4 ද, සහ බස්නාහිරට : අංක 2621 දරන පිඹුරේ ලොට් 4 ද යන මෙකී මායිම් තුළ පිහිටි ඉහතකී අංක 4525 පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම හයයි බිංදුව (අ.0, රූ.0, පර්.12.60) ක් වූ බිම් ප්‍රමාණය සහ ඒ මත පිහිටි ගහකොළ, ගොඩනැගිලි, වැවිලි ආදී සෑම සියලුදේ ද සමග වේ. මෙම ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

දේවිකා හල්වතුර,
කළමනාකාරිණී - අයකර ගැනීම්.

06 - 885

---

### පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී - කිරිබත්ගොඩ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගණුදෙනුකරුගේ නම : කරුණානායක චමින්ද ප්‍රදීප් සිල්වා

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් වර්ෂ 2018.05.30 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම්, ඉහත කී කරුණානායක චමින්ද ප්‍රදීප් සිල්වා යන අය "බන්ධනදායී/උකස්කරු" ලෙස ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ටී. එල්. එම්. ටී. විජේසිංහ විසින් සහතික කරන ලද වර්ෂ 2016.06.29 වැනි දිනැති අංක 555 දරන ප්‍රාථමික චල උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්ද,

ඉහත කී පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 555 දරන උකස්කරය මත,

(1) වර්ෂ 2018.05.02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් පහළොස් මිලියන එක් ලක්ෂ හතලිස් එක් දහස් දෙසිය අසූ දෙකයි ශත නවයක (රු. 15,141,282.09) මුදලක් ද, සහ වෂී 2018.05.03 වැනි දින සිට රුපියල් දහ හතර මිලියන පන් ලක්ෂ හැට හය දහස් හයසිය අටයි ශත අනූ හතක් (රු. 14,566,608.97) දක්වා වූ මුදල මත වර්ෂයකට 18% ක පොළිය ද, සහ

(2) වර්ෂ 2018.05.02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් හතලිස් තුන් ලක්ෂ විසි තුන් දහස් හත්සිය හැත්තෑ එකයි ශත අනූ හතරක (රු. 4,323,771.94) මුදලක් ද, සහ වෂී 2018.05.03 වැනි දින සිට රුපියල් හතලිස් එක් ලක්ෂ පනස් නව දහස් පන්සිය විසි තුනයි ශත දහ අටක් (රු. 4,159,523.18) දක්වා වූ මුදල මත වර්ෂයකට 18% ක් පොළිය ද, ඉහත කී බන්ධනදායී/උකස්කරුගෙන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින්ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

ඉහත කී උකස්කරය මත අයවිය යුතු එකී රුපියල් දහනව මිලියන හාර ලක්ෂ හැට පන් දහස් පනස් හතරයි ශත තුනක (රු. 19,465,054.03) මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසියේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොළිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද

ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අය කර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මහනුවර, මාවිල්මඩ, දුටුගැමුණු මාවත, අංක 369/1 හි පදිංචි බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජා ඇල ප්‍රාදේශීය සභා සීමාවේ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අංක 181G දඹුව ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ, රාගම පිහිටි වරිපනම් අංක 15/ඒ, ලෙන්වියාවත්ත පාර රාගම එස්ටේට් සහ දැන් නියදගල යනුවෙන් හැඳින්වෙන ඉඩමට බලයලත් මිනින්දෝරු ලක්ෂ්මන් ගුණසේකර විසින් මැන සාදන ලද වෂී 2015.09.01 දිනැති අංක 6223 දරන (බලයලත් මිනින්දෝරු එස්. ඩී. චන්ද්‍රතිලක විසින් මැන සාදන ලද වෂී 1996.03.18 දිනැති අංක 23/396 දරන පිඹුරේ දක්වා ඇති ඉඩම් කැබලිවල අනුබෙදීමක් වන) පිඹුරෙහි දැක්වෙන ලොට් X දරන ඉඩමට මායිම්, උතුරට : දඹුව පාර ද, නැගෙනහිරට: බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් මැන සාදන ලද වෂී 1993.03.23 දිනැති අංක 2948 දරන පිඹුරේ ලොට් 3 ද, දකුණට : බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් මැන සාදන ලද වෂී 1993.03.23 දිනැති අංක 2948 දරන පිඹුරේ ලොට් 2 ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් මැන සාදන ලද වෂී 1993.03.23 දිනැති අංක 2948 දරන පිඹුරේ ලොට් 3 (වඩාත් නිවැරදිව මෙම පිඹුරේ ලොට් 1) ද මායම් වූ ප්‍රමාණයෙන් පර්චස් තිස් හතරයි දශම හතරයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 34.40) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගහකොළ, වැවිලි සහ සෑම සියලු දේ ද සමග වේ. ඉහත ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඉහත ලොට් X දරන ඉඩම පහත දැක්වෙන ඉඩමේ අනු බෙදීමක් වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජා ඇල ප්‍රාදේශීය සභා සීමාවේ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අංක 181G දඹුව ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ, රාගම පිහිටි රාගම එස්ටේට් සහ දැන් නියදගල යනුවෙන් හැඳින්වෙන ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඩී. චන්ද්‍රතිලක විසින් මැන සාදන ලද වෂී 1996.03.18 දිනැති අංක 23/396 දරන පිඹුරේ ලොට් X දරන ඉඩමට මායිම්, උතුරට : දඹුව පාර ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් මැන සාදන ලද වෂී 1993.03.23 දිනැති අංක 2948 දරන පිඹුරේ ලොට් 3 ද, දකුණට : බලයලත් මිනින්දෝරු කේ.ඊ.ජේ.බී. පෙරේරා විසින් සැන සාදන ලද වෂී 1993.03.23 දිනැති අංක 2948 දරන පිඹුරේ ලොට් 2 ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් මැන සාදන ලද වෂී 1993.03.23 දිනැති අංක 2948 දරන පිඹුරේ ලොට් 2 ද මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විස්සක (අ. 0, රූ. 1, පර්. 20) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගහකොළ, වැවිලි සහ සෑම සියලු දේ ද සමග වේ. ඉහත ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

දේවිකා හල්වතුර,
කළමනාකාරිණී - ණය අයකර ගැනීම්.

06 - 886

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - අරලගන්විල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතියයි

කෙරගල අප්පුහාමිලාගේ සුනිල් ප්‍රේමරත්න සහ කෙරගල අප්පුහාමිලාගේ චමින්ද පුෂ්පකුමාර.

2018 මාර්තු මස 06 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ගාල්ලගේ විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2016 මැයි 20 වැනි දින සහතික කළ අංක 3055 සහ 2016 දෙසැම්බර් මස 30 වැනි දින සහතික කළ අංක 3196 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කෙරගල අප්පුහාමිලාගේ සුනිල් ප්‍රේමරත්න සහ කෙරගල අප්පුහාමිලාගේ චමින්ද පුෂ්පකුමාර ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් හැට හත්ලක්ෂ දාහත් දහස් නමසිය තුනයි ශත පනස් නමයක (රු. 6,717,903.59) සංවර්ධන ණය මුදලක් 2018 ජනවාරි මස 10 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්ද එකී රු. 6,717,903.59 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2018 ජනවාරි 11 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 3055 සහ 3196 දරන බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර

කොට ඇත්තාවූද දේපළ හා පරිශ්‍රය මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### පළමුවන උපලේඛනය

උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය සභා සීමාව තුළ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පත්තුවේ, අංක 162 වීරපෙදෙස ග්‍රාම නිලධාරි වසමේ උඩවෙලගම, කදුරුවෙල ගමේ හි පිහිටි කදුරුවෙල කැළේ ගොඩ නැමති ඉඩමට සර්වේයර් ජෙනරාල් භාරයේ තබා ඇති සහතිකයේ එෆ් සී පී පො 34 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 130 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන්, උතුරට : ලොට් අංක 316 සහ 318 න් ද, නැගෙනහිරට : ලොට් අංක 131 කොටසකින් ද, දකුණට : ලොට් අංක 146 න් ද සහ බස්නාහිරට : ලොට් අංක 129 න් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව හෙක්ටයාර් බිංදුවයි දශම නමයයි එකයි අටයි එකක් 0.9181 විශාලත්වයෙන් වූ ඉඩම සමග ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

### දෙවන උපලේඛනය

උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පත්තුවේ, අංක 162 වීරපෙදෙස ග්‍රාම නිලධාරි වසමේ උඩවෙලගම, කදුරුවෙල ගමේ හි පිහිටි කදුරුවෙල කැළේ ගොඩ නැමති ඉඩමට සර්වේයර් ජෙනරාල් භාරයේ තබා ඇති සහතිකයේ එෆ් සී පී පො 34 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද කොටසට බලයලත් මිනින්දෝරු ඩී. මුදුන්කොත්ගේ විසින් 2014 ජූලි 10 වැනි දින මැන සාදන ලද අංක 2665 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : (එෆ්. සී. පී. පෝ. 34 හි ලොට් 130 කොටස) මෙම ඉඩමේම එච්. ජී. ඩිංගිරි බණ්ඩාට අයිති ඉතිරි කොටස සහ එෆ්. සී. පී. පො. 34 හි ලොට් අංක 129 න් ද, නැගෙනහිරට : (එෆ්. සී. පී. පො. 34 හි ලොට් 130 කොටස) මෙම ඉඩමේම එච්. ජී. ඩිංගිරි බණ්ඩාට අයිති ඉතිරි කොටසෙන් ද, දකුණට : (එෆ්. සී. පී. පෝ. 34 හි ලොට් 146) පාරෙන් ද සහ බස්නාහිරට : එෆ්. සී. පී. පො. 34 හි ලොට් අංක 129 න් ද මායිම්වූ පිඹුර ප්‍රකාරව හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි අටයි අටයි පහක් 0.0885 හෙවත් පර්චස් තිස් පහක (අ. 0, රූ. 0, පර්. 35) විශාලත්වයෙන් වූ ඉඩම් සමග ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනිකුත් සියලු දේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

06 - 887

---

### නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී (ලියාපදිංචි අංක PQ 118 දරන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018.04.27 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කල්ලපාත විතානගේ කපිල සිරිසේන සහ වඩු මේස්ත්‍රී ගීතා ජයලංකා.

මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කල්ලපාත විතානගේ කපිල සිරිසේන සහ වඩු මේස්ත්‍රී ගීතා ජයලංකා යන අය විසින් ලබාගත් මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන්, බන්ධනදායීන් වශයෙන් ක්‍රියාකරමින් කල්ලපාත විතානගේ කපිල සිරිසේන යන අය සහ උකස්කරු වශයෙන් ක්‍රියාකරමින් වඩු මේස්ත්‍රී ගීතා ජයලංකා යන අය විසින් ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කුළසේකර අබයරත්න අදිකාරම් මුදියන්සේ රාළහාමිලාගේ නේත්‍රරානි කුළසේකර විසින් සහතික කරන ලද අංක 1068 සහ 2017.07.14 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් කොළඹ 02, යූනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමින් උකස් කොට, ඇපයට තබා ඇති බැවින් ද,

එකී බැඳුම්කරය මගින් ඇප තබන ලද ඉහත කී පහසුකම් මත ආපසු ගෙවීම් කල්ලපාත විතානගේ කපිල සිරිසේන සහ වඩු මේස්ත්‍රී ගීතා ජයලංකා යන අය විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද,

ඒ අනුව, 2017.12.19 වැනි දිනට අයිරා පහසුකම මත අයවිය යුතු රුපියල් දෙකෝටි හත්ලක්ෂ දහතරදහස් හාරසියහැටකුත් ශත තිස්හතරක (රු. 20,714,460.34) මුදල සහ 2017.12.09 වැනි දිනට හිඟ මුල් මුදල වන රුපියල් දෙකෝටි පන්ලක්ෂ අනූපන්දහස් තුන්සිය පනස් අටකුත් ශත හතළිස් එකක (රු. 20,595,358.41) මුදල මත එකඟ වූ පරිදි 2017.12.10 වැනි දින සිට තවදුරටත් පොළිය ද, තව ද, සම්බන්ධිත ගාස්තු, ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් යම් ගාස්තු ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් (වෙතොත්) එම මුදල අඩු කොට, අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඕක්ෂනියර්ස් හි ත්‍රිවංක සී. සේනානායක මහතා හෝ එල්. බී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ, අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 81 දරන ගොඩහේන ග්‍රාම නිලධාරි වසමේ ගොඩහේන ගමේ පිහිටි නාගස්කැලේ නැමති ඉඩමේ කැබලි අංක C4 සහ C5 දරන ඉඩම් ඒකාබද්ධ කළ කැබලි අංක 2A3 දරන ඉඩම් කොටසට බලයලත් මිනින්දෝරු උපාලි අකුරටිය විසින් මැන සාදන ලද අංක 668 සහ 2016.10.11 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කළ කැබලි අංක A දරන බිම් කොටසට මායිම්, උතුරට : පාර සහ නාගස්කැලේ ඉඩමේ කැබලි අංක C4 සහ C5 දරන ඉඩම් කොටස් ද, නැගෙනහිරට : කැබලි අංක 2B දරන ඉඩම් කොටස ද, දකුණට : කුරුළුහේන නාගස්කැලේ ඉඩමේ කැබලි අංක C6 දරන ඉඩම් කොටස ද, බස්නාහිරට : කැබලි අංක 2A1 සහ කැබලි අංක B දරන ඉඩම් කොටස් ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 668 දරන පිඹුර අනුව අක්කර තුනක් (අ. 3, රූ. 0, පර්. 0) විශාල ඉඩම, පස ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය. මෙම දේපළ බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 153/83 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යුනියන් පෙදෙස,
කොළඹ 02.

06 - 888

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018.05.25 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

බෝදාහන්දි ලොයිඩ් ජිනරන්ජන් ද සිල්වා.

ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඩී. පී. එස්. කරුණානායක විසින් සහතික කරන ලද අංක 4200 සහ 2011 අගෝස්තු මස 26 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය, ඉහත කී බෝදාහන්දි ලොයිඩ් ජිනරන්ජන් ද සිල්වා යන අය විසින් ලබාගත් මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් බන්ධනදායී/උකස්කරු ලෙස ක්‍රියාකරමින් ඉහත කී, බෝදාහන්දි ලොයිඩ් ජිනරන්ජන් ද සිල්වා යන අය විසින් කොළඹ 02, යුනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමින් උකස් කොට, ඇපයට තබා ඇති බැවින් ද, එකී බැඳුම්කරය මගින් ඇප තබන ලද ඉහත කී පහුස්කම් මත ආපසු ගෙවීම ඉහත කී බෝදාහන්දි ලොයිඩ් ජිනරන්ජන් ද සිල්වා යන අය විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද,

ඒ අනුව, රුපියල් පනස්නවලක්ෂ අනූඑක්දහස් හාරසිය විසිහතරකුත් ශත විසිහයක (රු. 5,991,424.26) මුදල සහ වාර ණය පහුසකම මත 2017.12.12 වැනි දිනට හිඟ මුල් මුදල වන රුපියල් හතළිස්හයලක්ෂ පනස්තුන්දහස් අටසිය හතළිස්හයකුත් ශත විස්සක (රු. 4,653,846.20) මුදල මත 2017.12.13 වැනි දින සිට තවදුරටත් පොළිය ද, තව ද, සම්බන්ධිත ගාස්තු, ව්‍යවස්ථාපිත අයිකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් යම් ගාස්තු ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් (වෙතොත්) එම මුදල අඩු කොට, අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි ත්‍රිවංක සී. සේනානායක මහතා සහ/හෝ එල්. බී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ, බොරැල්ලේ පිහිටි, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවතේ (කළින් කොටා පාරේ) දැනට වරිපනම් අංක 60A දරන, බලයලත් මිනින්දෝරුර එස්. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද අංක 1757 සහ 1985 පෙබරවාරි මස 09 වැනි දින දරන පිඹුර ප්‍රකාර නැවත මැන බෙදා වෙන්කළ කැබලි අංක A 2 (පාර පුළුල් කිරීමට පසුව) දරන බිම් කොටසට බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද අංක 5080/9000 සහ 2008 අගෝස්තු මස 19 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කළ කැබලි අංක A 2A දරන බිම් කොටසට මායිම්, උතුරට : ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත (කළින් කොටා පාර) ද, නැගෙනහිරට : ආචාර්ය එන්. එම්. පෙරේරා මාවතේ වරිපනම් අංක 62A දරන පරිශ්‍රය ද, දකුණට : ආචාර්ය එන්. එම්. පෙරේරා මාවතේ වරිපනම් අංක 60/1 දරන පරිශ්‍රය ද බස්නාහිරට : ආචාර්ය එන්. එම්. පෙරේරා මාවතේ වරිපනම් අංක 60 දරන පරිශ්‍රය ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 5080/9000 දරන පිඹුර අනුව පර්චස් හතයි දශම හයයි හයක් (අ. 0, රූ. 0, පර්. 7.66) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි සෑම සියලු දේත් සමග ය.

ඉහත කී අංක 5080/9000 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක A 2A දරන බිම් කොටස වනාහි බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද අංක 1757 සහ 1985 පෙබරවාරි මස 09 වැනි

දින දරන පිඹුරේ නිරූපිත කැබලි අංක A2 දරන බිම් කොටසේ (පාර පුළුල් කිරීමට පසුව) නැවත මැන බෙදා වෙන් කිරීමක් වන අතර, එකී බිම් කොටස පහත සඳහන් පරිදි සවිස්තරව දැක්වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහනගර සභා සීමාව තුළ, බොරැල්ලේ පිහිටි, කළින් කොටා පාරේ (ආචාර්ය එන්. එම්. පෙරේරා මාවතේ) වරිපනම් අංක 60 (කොටසක්) දරන, දැනට ආචාර්ය එන්. එම්. පෙරේරා මාවතේ වරිපනම් අංක 60A දරන, බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද අංක 1757 සහ 1985 පෙබරවාරි මස 09 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කළ කැබලි අංක A 2 දරන බිම් කොටසට මායිම් උතුරට : කොටා පාර ද, නැගෙනහිරට : කොටා පාරේ වරිපනම් අංක 62 ද, දකුණට : කොටා පාරේ වරිපනම් අංක 60/1 ද, බස්නාහිරට : එකී අංක 1757 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක A1 ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1757 දරන පිඹුර අනුව පර්චස් නවයයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 9.25) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි සෑම සියලු දේත් සමගය. මෙම දේපළ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A729/164 දරන පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යුනියන් පෙදෙස,
කොළඹ 02.

06 - 889

---

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී (ලියාපදිංචි අංක PQ 118 දරන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018.04.27 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එල්. ෆෝන්ස් යන නාමය විලාසය සහ අභිධානය යටතේ තනි හිමිකාරත්වයක් සහිත ව්‍යාපාරයක් පවත්වාගෙන යන සමීර විමලසිරි දේවසුරේන්ද්‍ර.

මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය, සමීර විමලසිරි දේවසුරේන්ද්‍ර යන අය විසින් ලබාගත් මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන්, උකස්කරු සහ බන්ධනදායී වශයෙන් ක්‍රියාකරමින් එකී විමලසිරි දේවසුරේන්ද්‍ර යන අය විසින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රදීපා ප්‍රියදර්ශනී වික්‍රමතිලක විසින් සහතික කරන ලද අංක 2147 සහ 2016.10.06 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් කොළඹ 02, යුනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමින් උකස් කොට, ඇපයට තබා ඇති බැවින් ද,

එකී බැඳුම්කරය මගින් ඇප තබන ලද ඉහත කී පහසුකම් මත ආපසු ගෙවීම් එකී, විමලසිරි දේවසුරේන්ද්‍ර යන අය විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද,

ඒ අනුව,

(i) වාර ණය පහුසකම මත අයවිය යුතු රුපියල් තිස්ලක්ෂ තිස්අටදහස් එකසිය අනූහතකුත් ශත හැටතුනක (රු. 3,038,197.63) මුදල සහ හිඟ මුල් මුදල වන රුපියල් විසිනවලක්ෂ හත්දහස් හාරසිය අසූනවයකුත් ශත පනස්හයක (රු. 2,907,489.56) මුදල මත එකඟ වූ පරිදි 2018.03.20 වැනි දින සිට තවදුරටත් පොලිය ද,

(ii) අයිරා පහසුකම මත අයවිය යුතු රුපියල් විසිහත්ලක්ෂ විසිඑක්දහස් අටසිය පනස්හතකුත් ශත අසූහතරක (රු. 2,721,857.84) මුදල සහ හිඟ මුල් මුදල වන රුපියල් විසිහයලක්ෂ අසූදෙදහස් අටසිය අසූහයකුත් ශත අනූහතරක (රු. 2,682,886.94) මුදල මත එකඟ වූ පරිදි 2018.03.20 වැනි දින සිට තවදුරටත් පොලිය ද, තව ද, සම්බන්ධිත ගාස්තු, ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් යම් ගාස්තු ප්‍රමාණයන්ද, තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් (වෙතොත්) එම මුදල අඩු කොට, අයකර ගැනීම සඳහා :

මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඕක්ෂනියර්ස් හි ත්‍රිවංක සී. සේනානායක මහතා හෝ එල්. බී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය සභා සීමාවේ, අංක 710B දරන බටහිර කුඩා වස්කඩුව ග්‍රාම නිලධාරි වසමේ කුඩා වස්කඩුව ගමේ පිහිටි මානගලවත්ත කට්ටිය නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. එස්. සී. විතාන විසින් මැන සාදන ලද අංක 4174 සහ 2012.11.10 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කළ කැබලි අංක 6 දරන බිම් කොටසට මායිම්, උතුරට : මෙම පිඹුරේ නිරූපිත කැබලි අංක 5 ද, නැගෙනහිරට : පාර ද, දකුණට : අංක 1114 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 2 ද, බස්නාහිරට : මෙම පිඹුරේ නිරූපිත කැබලි අංක 4 ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහඅටකුත් දශම අටයි නවයක් (අ. 0, රූ. 0,

පර්. 18.89) විශාල ඉඩම් කැබැල්ල, ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය. මෙම දේපළ කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 30/31 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

තව ද, ඉහත කී ඉඩමට පහත විස්තර කරන ඉඩමේ මාර්ග අයිතිය ද සමග ය.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය සභා සීමාවේ, අංක 710B දරන කුඩා වස්කඩුව ග්‍රාම නිලධාරි වසමේ කුඩා වස්කඩුව ගමේ පිහිටි මානගලවත්ත කට්ටිය නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. එස්. සී. විතාන විසින් මැන සාදන ලද අංක 4174 සහ 2012.08.14 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කළ කැබලි අංක 12 දරන බිම් කොටස (අඩි 10ක් පළල පාරට) මායිම්, උතුරට : කැබලි අංක 1 සහ 2 ද, නැගෙනහිරට : අංක 1114 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 2 ද, දකුණට : කැබලි අංක 10 සහ 11 ද, බස්නාහිරට : වෙරළද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් හතක් (අ. 0, රූ. 0, පර්. 7) විශාල ඉඩම් කැබැල්ලය. මෙම දේපළ කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 30/37 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා.
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

06 - 890

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී (ලියාපදිංචි අංක PQ 118 දරන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018.04.27 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

පණාමුල්ල ආරච්චිගේ කසුන් ධනුෂ්ක ලක්මාල්.

මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය, පණාමුල්ල ආරච්චිගේ කසුන් ධනුෂ්ක ලක්මාල් යන අය විසින් ලබාගත් මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන්, උකස්කරු සහ බන්ධනදායී වශයෙන් ක්‍රියාකරමින් එකී පණාමුල්ල ආරච්චිගේ කසුන් ධනුෂ්ක ලක්මාල් යන අය විසින් ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කුළසේකර අබයරත්න අදිකාරම් මුදියන්සේ රාළහාමිලාගේ නේත්‍රානි කුළසේකර විසින් සහතික කරන ලද අංක 995 සහ 2017.02.20 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් කොළඹ 02, යූනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමින් උකස් කොට, ඇපයට තබා ඇති බැවින් ද,

එකී බැඳුම්කරය මගින් ඇප තබන ලද ඉහත කී පහසුකම් මත ආපසු ගෙවීම් පණාමුල්ල ආරච්චිගේ කසුන් ධනුෂ්ක ලක්මාල් යන අය විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද,

ඒ අනුව,

(i) වාර ණය පහසුකම මත අයවිය යුතු රුපියල් හතළිස් නව ලක්ෂ තිස්හතර දහස් නවසිය අනූහතකුත් ශත විසිඑකක (රු. 4,934,997.21) මුදල සහ හිඟ මුල් මුදල වන රුපියල් හතළිස් පන් ලක්ෂ තිස්නව දහස හයසියතිස් නවයකුත් ශත තිස්දෙකක (රු. 4,539,639.32) මුදල මත එකඟ වූ පරිදි 2018.02.02 වැනි දින සිට තවදුරටත් පොළිය ද,

(ii) අයිරා පහසුකම මත අයවිය යුතු රුපියල් දහතුන් ලක්ෂ පනස් නව දහස් හාරසිය හැත්තෑ එකකුත් ශත පහළොවක (රු. 1,359,471.15) මුදල සහ හිඟ මුල් මුදල වන රුපියල් දහතුන් ලක්ෂ පනස් අට දහස් හාරසිය විසි නවයකුත් ශත හතක (රු. 1,358,429.07) මුදල මත එකඟ වූ පරිදි 2018.02.02 වැනි දින සිට තව දුරටත් පොළිය ද,

තව ද, සම්බන්ධිත ගාස්තු, ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් යම් ගාස්තු ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් (වෙතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා,

මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි ත්‍රිවංක සී. සේනානායක මහතා හෝ එල්. බී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න කෝරළයේ, දියපොතගම් පත්තුවේ, ඇඹිලිපිටිය නගර සභා සීමාවේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩගම ග්‍රාම නිලධාරි වසමේ, ඇඹිලිපිටියේ උඩගම ගමේ පිහිටි පානමුර පාරේ (වමේ) වරිපනම් අංක 195/27 දරන ජාසින්ගේ ඉඩම නමැති ඉඩමේ කොටසක ඒකාබද්ධ කළ කැබලි අංක 1 සහ 2 දරන ඉඩමට බලයලත්

මිනින්දෝරු එච්. එම්. ඒ. යූ, නවරත්න විසින් මැන සාදන ලද අංක 0647 සහ 2014.08.21 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කළ කැබලි අංක A දරන බිම් කොටසට මායිම්, උතුරට : පනාමුරේ සිට ඇඹිලිපිටිය දක්වා වැටී ඇති ඉහළ පාර ද, නැගෙනහිරට : අංක 5053 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක B (පාර) ද, දකුණට : කැබලි අංක 3 ද, බස්නාහිරට : අංක 149 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 1 ද යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 0647 දරන පිඹුර අනුව පර්චස් විස්සක් (අ. 0, රූ. 0. පර්. 20) විශාල ඉඩම් කැබැල්ල, පස ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් සමගය. මෙම දේපළ ඇඹිලිපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L 69/102 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා.
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

06 - 891

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ඩබ්ලිව්. ජී. දිල්හාන් සහ ටී ආර් ධර්මරත්න.
ගිණුම් අංක : 1003 5442 0462.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2018.04.26 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. ජී. අබේවික්‍රම යන අය විසින් ලියා සහතික කරන ලද 2015 සැප්තැම්බර් මස 11 දාතම හා අංක 2176 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වීරප්පුලිගේ ගනේෂ් දිල්හාන් සහ තමිලා රමණිලතා ධර්මරත්න යන අය බන්ධනදායීන් වශයෙන් සහ වීරප්පුලිගේ ගනේෂ් දිල්හාන් යන අය උකස්කරු වශයෙන් ද පැහැර ඇති හෙයින් ද එහි අංක 2176 දරන බැඳුම්කරය ප්‍රකාර අයවියයුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් හැට තුන් ලක්ෂ විසි හය දහස් එකසිය හැත්තෑ තුනයි ශත විස්සක (රු. 6,326,173.20) මුදලක් 2018 මාර්තු මස 26 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් හැට තුන් ලක්ෂ විසි හය දහස් එකසිය හැත්තෑ තුනයි ශත විස්සක (රු. 6,326,173.20) මුදල ද, 2018 මාර්තු මස 27 වැනි දින සිට අංක 2176 දරන එකී බැඳුම්කරය මත අයවියයුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් නම ලක්ෂ හැත්තෑ හත් දහස් හාරසිය එකොළහයි ශත හැත්තෑ හතක (රු. 5,977,411.77) මුදලක් සඳහා වාර්ෂිකව සියයට නමයයි දශම පහක් (9.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබීඇති යම් මුදලක් (වෙතොත්) ඒවාද අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 2176 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ මහරගම නගර සභා සීමාවන් තුළ මාදිවෙල අංක 524 - දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මාදිවෙල පිහිටි මාදිවෙල පාර වරිපනම් අංක. 352/D4 දරන "නින්දෝරුවැල්ල කුඹුර, පරගහ කුඹුර, බෙල්අත්තේ කුඹුර, දෙල්ගහ කුඹුර, අඹගහ කුඹුර, පුවක්වැටිය කුඹුර, පැලැන්ගහ කුඹුර සහ කැකුණගහ කුඹුර" (බලයලත් මානක තැන එල්. පී. ඒ. ශාන්ත ප්‍රිය පෙරේරා යන අය විසින් සාදන ලද 2007 ඔක්තෝබර් මස 17 දාතම හා අංක 2252 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 හි දැනට පවත්නා සීමාවන් මත නැවත මිනුමක් සහ උපබෙදුමක් වන) යය කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. එම්. ඒ. එච්. බණ්ඩාර යන අය විසින් සාදන ලද 2009 ඔක්තෝබර් මස 25 දාතම හා අංක 3466 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 60 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 50, 51 සහ 53, නැගෙනහිරට : ලොට් 53, 54 සහ 59, දකුණට : ලොට් 59 සහ 61 සහ බස්නාහිරට : ලොට් 51 සහ 50 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතක් (A:0 R:0 P:7) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ එහි අංක 3466 දරන පිඹුරට අනුවය.

අංක 3466 දරන පිඹුරේ නිරූපිත ලොට් 13, 26, 32, 33, 40, 47, 49, 61 සහ 63 වශයෙන් ලකුණුකොට ඇති සියලුම මාර්ග වෙන්කිරීම් දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද ඒවා යටින් ද ඇතුළු වෙනත් පොදු අයිතීන් ද සමගය.

එකී පිඹුරු අංක. 3466 හි නිරූපිත ලොට් 60 වශයෙන් ලකුණු කොට ඇති එකී ඉඩම් කොටස, බලයලත් මානක තැන එල්. පී. ඒ. ශාන්ත පී. පෙරේරා යන අය විසින් සාදන ලද 2007 ඔක්තෝබර් මස 17 දාතම හා අංක 2252 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 හි දැනට පවත්නා මායිම් මත නැවත මිනුමක් සහ උපබෙදුමක් වන අතර එය වෙනත් අයුරකින් රජයේ මිනින්දෝරු එච්. ඒ. ඩී. එස්. ප්‍රේමසිරි යන අය විසින් සාදන ලද 1999 ඔක්තෝබර් මස 14 දාතම හා එකී අංක Co. 8098 දරන P. පිඹුරේ නිරූපිත ලොට් 8, 9, 10 සහ 11 බලයලත් මානක තැන එල්. පී. ඒ. ශාන්ත ප්‍රිය පෙරේරා යන අය විසින් සාදන ලද 2006.08.23 දාතමින් පිටසන් කරන ලද හා එල්. පී. ඒ. ශාන්ත පෙරේරා විසින් සාදන ලද 2000.11.08 දාතම හා අංක 1366 හි ලොට් 1 හි නැවත මිනුමක්, උපබෙදුමක් සහ ඒකාබද්ධයක් ද වන අතර (සර්වේයර් ජනරාල් වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (ඉඩම් සහ දේපළ), පී. වඩුගෙදර යන අය විසින් සාදන ලද 1981 අගෝස්තු මස 20 දාතම හා Co. 5530 දරන P. පිඹුරේ නිරූපිත ලොට් 1 සහ 28 දක්වා) එය පහත සඳහන් පරිදිය.

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ මහරගම නගර සභා සීමාවන් තුළ මාදිවෙල අංක 524 - දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මාදිවෙල පිහිටි " නින්දෝරවැල්ල කුඹුර, පරගහ කුඹුර, බෙල්අත්තේ කුඹුර, දෙල්ගහ කුඹුර, අඹගහ කුඹුර, පුවක්වැටිය කුඹුර, පැලැන්ගහ කුඹුර සහ කැකුණගහ කුඹුර" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එල්. පී. ඒ. ශාන්ත ප්‍රිය පෙරේරා යන අය විසින් සාදන ලද 2000.11.08 දාතම හා අංක 1366 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 සර්වේයර් ජනරාල් විසින් සත්‍ය බවට සහතික කරන ලද 1981.08.20 දාතම හා අංක Co. 5530 දරන P. පිඹුරේ නිරූපිත ලොට් 1, 2, 3, 4 සහ 6 හි කොටස්වල ඒකාබද්ධයක් වන) වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මාදිවෙල පාර, ඔබවත්ත පාර සහ P.P. Co. 8098 නිරූපිත ලොට් 8, 9, 10 සහ 11 සහ මෙම පිඹුරේ ලොට් 2, නැගෙනහිරට : ඔබවත්ත පාර, දකුණට : ඇළ සහ මෙම පිඹුරේ ලොට් 2 සහ බස්නාහිරට : මාදිවෙල පාර, P.P. Co. 8098 නිරූපිත ලොට් 8, 9, 10 සහ 11, මෙම පිඹුරේ ලොට් 2 සහ ඇළ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර හතරයි රූඩ් තුනයි පර්චස් විසි පහයි දශම තුනක් (A:4 R:3 P:25.3) හෝ (හෙක්ටයාර 1.9864) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් , ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1366 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව M 3040/6 යටතේ ගල්කිස්ස (වර්තමානයේ දෙල්කඳ - නුගේගොඩ) ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ මහරගම නගර සභා සීමාවන් තුළ මාදිවෙල අංක 524 - දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මාදිවෙල පිහිටි "අඹගහවත්ත" යයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජනරාල් වෙනුවෙන් මිනින්දෝරු සුපිරින්ටෙන්ඩන්ට් එල්.එල්. එස්. රෝහිණී ගුණසේකර යන විසින් සහතික කරන ලද හා රජයේ මිනින්දෝරු එච්. ඒ. ඩී. එස්. ප්‍රේමසිරි යන අය විසින් සාදන ලද 1999 ඔක්තෝබර් මස 14 දාතම හා අංක Co. 8098 දරන P. පිඹුරේ නිරූපිත ලොට් 8 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් ඃ උතුරට : මාදිවෙල පාර, ඔබවත්ත පාර, නැගෙනහිරට : ලොට් 3, දකුණට : ලොට් 9 සහ බස්නාහිරට : ලොට් 9 සහ මාදිවෙල පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි බිංදුවයි අටයි බිංදුවක් (හෙක්ටයාර 0.0080) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක Co. 8098 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව M 3034/202 යටතේ ගල්කිස්ස (වර්තමානයේ දෙල්කඳ - නුගේගොඩ) ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

3. එකී මාදිවෙල පිහිටි "අඹගහවත්ත" යයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජනරාල් වෙනුවෙන් මිනින්දෝරු සුපිරින්ටෙන්ඩන්ට් එල්. එල්. එස්. රෝහිණී ගුණසේකර යන විසින් සහතික කරන ලද හා රජයේ මිනින්දෝරු එච්. ඒ. ඩී. එස්. ප්‍රේමසිරි යන අය විසින් සාදන ලද 1999 ඔක්තෝබර් 14 දාතම හා අංක Co. 8098 දරන P. පිඹුරේ නිරූපිත ලොට් 9 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මාදිවෙල පාර, ලොට් 8 සහ ඔබවත්ත පාර, නැගෙනහිරට : අංක Co. 5530 P පිඹුරේ ලොට් 1, දකුණට : අංක Co. 5530 P පිඹුරේ ලොට් 1 සහ ලොට් 10 සහ බස්නාහිරට : ලොට් 10 සහ මාදිවෙල පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි බිංදුවයි නමයයි බිංදුවක් (හෙක්ටයාර 0.0090) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක Co. 8098 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව M 3034/203 යටතේ ගල්කිස්ස (වර්තමානයේ දෙල්කඳ - නුගේගොඩ) ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

4. එකී මාදිවෙල පිහිටි "අඹගහවත්ත" යයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජනරාල් වෙනුවෙන් මිනින්දෝරු සුපිරින්ටෙන්ඩන්ට් එල්. එල්. එස්. රෝහිණී ගුණසේකර යන විසින් සහතික කරන ලද හා රජයේ මිනින්දෝරු එච්. ඒ. ඩී. එස්. ප්‍රේමසිරි යන අය විසින් සාදන ලද 1999 ඔක්තෝබර් 14 දාතම හා අංක Co. 8098 දරන P පිඹුරේ නිරූපිත ලොට් 10 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මාදිවෙල පාර, ලොට් 9 සහ අංක Co. 5530 P පිඹුරේ ලොට් 1, නැගෙනහිරට : අංක Co. 5530 P පිඹුරේ ලොට් 1, දකුණට : අංක Co. 5530 P පිඹුරේ ලොට් 1 සහ 2 ලොට් 11 සහ බස්නාහිරට : ලොට් 11 සහ මාදිවෙල පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි තුනයි හයයි බිංදුවක් (හෙක්ටයාර 0.0360) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සෑම සියලු දේ එහි අංක Co. 8098 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව M 3034/204 යටතේ ගල්කිස්ස (වර්තමානයේ දෙල්කඳ - නුගේගොඩ) ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

5. සර්වේයර් ජනරාල් වෙනුවෙන් මිනින්දෝරු සුපිරින්ටෙන්ඩන්ට් එල්. එල්. එස්. රෝහිණී ගුණසේකර යන විසින් සහතික කරන ලද හා රජයේ මිනින්දෝරු එච්. ඒ. ඩී. එස්. ප්‍රේමසිරි යන අය විසින් සාදන ලද 1999 ඔක්තෝබර් 14 දාතම හා අංක Co. 8098 P දරන පිඹුරේ නිරූපිත ලොට් 11 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මාදිවෙල පාර සහ ලොට් 10, නැගෙනහිරට : ලොට් 10, අංක Co. 5530 P පිඹුරේ ලොට් 1 සහ 2, දකුණට : අංක Co. 5530 P පිඹුරේ එහි පිහිටි ලොට් 2 සහ 3 සහ

බස්නාහිරට : මාදිවෙල පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි තුනයි නමයයි බිංදුවක් (හෙක්ටයාර 0.0390) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක Co. 8098 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව M 3034/205 යටතේ ගල්කිස්ස (වර්තමානයේ දෙල්කඳ - නුගේගොඩ) ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, නුගේගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ මාදිවෙල සහ උඩහමුල්ල පිහිටි "නින්දරවැල්ල කුඹුර, පරගහ කුඹුර, බෙල්අත්තේ කුඹුර, දෙල්ගහ කුඹුර, අඹගහ කුඹුර, පුවක්වැටිය කුඹුර, පැලැන්ගහ කුඹුර *නොහොත්* කැකුණගහ කුඹුර, ගොඩපරගහ කුඹුර, ගොඩපරගහ කුඹුර *නොහොත්* කෙටදෙණියේ කුඹුර, හාල්පත් කුඹුර, කුඹුක්ගහ කුඹුර *නොහොත්* පැලැන්ගහ කුඹුර, මිල්ලගහ කුඹුර, කුඹුක්ගහ කුඹුර, කුඹුක්ගහ කුඹුර *නොහොත්* ගොනාකන්ද කුඹුර" යයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජනරාල් වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (ඉඩම් සහ දේපළ), පී. වඩුගෙදර යන අය විසින් සාදන ලද 1981 අගෝස්තු මස 20 දාතම හා අංක Co. 5530 දරන P. පිඹුරේ නිරූපිත ලොට් 1 සිට 28 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටස් වලට මායිම් : උතුරට : මහා මාර්ගය, නැගෙනහිරට : පිට ඇළ, පාර, පිට ඇළ, පාර, පිට ඇළ, පාර, පිට ඇළ, අනුර මාවත, පිට ඇළ, ඊ.ඩී. ජිනදාස වීරසූරිය සහ ඊ.ඩී. ජිනදාස යන අය විසින් හිමිකම් කියනු ලබන දෙල්ගහවත්ත යයි කියනු ලබන ඉඩම, පාර, එස්. ජයසිංහ, එන්.ජේ. විජේසිංහ, ඊ.එච්. සෝමවතී, කේ.ජේන් නෝනා සහ ඒ.ඒ.ඩී. මාටින් යන අය විසින් හිමිකම් කියනු ලබන දෙල්ගහවත්ත යයි කියනු ලබන ඉඩම, දකුණට : අංක Co. 1801 P. පිඹුරේ ලොට් 1, පිට ඇළ, ජී.ජී. සේනාරත්න යන අය විසින් හිමිකම් කියනු ලබන දෙල්ගහවත්ත යයි කියනු ලබන ඉඩම, එස්. ජයවර්ධන යන අය විසින් හිමිකම් කියනු ලබන ගොන්නකන්ද යයි කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : එස්. ජයවර්ධන, ටී.ජී. ආරියදාස, ඩබ්ලිව්. බොතේජු සහ සිරිල් සේනාරත්න යන අය විසින් හිමිකම් කියනු ලබන ගොන්නකන්ද යයි කියනු ලබන ඉඩම පාර, ඊ. ඩී. පවුලිස් යන අය විසින් හිමිකම් කියනු ලබන කුඹුක්ගහ ඕවිට යයි කියනු ලබන ඉඩම, ඊ. ඩී. ජිනදාස යන අය විසින් හිමිකම් කියනු ලබන දෙල්ගහවත්ත යයි කියනු ලබන ඉඩම, එස්. ඩී, එමලින් නෝනා, එස්. ඩී. සිරිල්, ටී. චන්ද්‍රපාල, එච්. ඩේවිඩ් සහ එච්. ඇල්බට් යන අය විසින් හිමිකම් කියනු ලබන ගොඩපරගහවත්ත යයි කියනු ලබන ඉඩම, එස්. ඩී. සෙනෙහෙවතී යන අය විසින් හිමිකම් කියනු ලබන ගලබඩගහවත්ත යයි කියනු ලබන ඉඩම, එස්. ඩී. සරණපාල සහ පියදාස සිල්වා යන අය විසින් හිමිකම් කියනු ලබන ගොන්නගහවත්ත යයි කියනු ලබන ඉඩම, එස්.ඩී. සරණපාල සහ ජී. වින්සන් ද සිල්වා යන අය විසින් හිමිකම් කියනු ලබන ගොන්නගහවත්ත යයි කියනු ලබන ඉඩම, බී. ඩී. කුරේ, ජී. එච්. ගුණපාල, ජී. එච්. එඩ්වඩ් සහ ලීලාවතී අතුකෝරල යන අය විසින් හිමිකම් කියනු ලබන ලාවුළුගහවත්ත යයි කියනු ලබන ඉඩම, මාදිවෙල පාර, ජේ. මාටින් පෙරේරා, ඊ. ඩී. කරුණාසේන, පී. ඒ. පියවතී සහ එන්. නිව්ටන් පීරිස් යන අය විසින් හිමිකම් කියනු ලබන වරිපනම් අංක 290, 292, 294 සහ 296 දරන පරිශ්‍රයන්, එස්. කේ. විජේරත්න සහ ජේ. හෙරස් පෙරේරා යන අය විසින් හිමිකම් කියනු ලබන ගොඩපරගහවත්ත යයි කියනු ලබන ඉඩම, මාදිවෙල පාර සහ අසෙල් විජේසිංහ, ඩබ්ලිව්.ජී. පෙරේරා, ඩබ්ලිව්.ඩී. ඇල්බට්, පී.කේ. මල්ලිකා පෙරේරා සහ ඩී.ඩී, පියදාස යන අය විසින් හිමිකම් කියනු ලබන අඹගහවත්ත යයි කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර තිස් හතයි රූඩ් එකයි පර්චස් තිස් තුනක් (A:37 R:1 P:33) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග වෙළුම/පත්‍රිරුව M 1578/70 යටතේ ගල්කිස්ස (වර්තමානයේ දෙල්කඳ - නුගේගොඩ) ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

06 - 894/1

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

**2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය**

එස්. සූතාකරන්.
ගිණුම් අංක : 0125 5000 0391.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2018.04.26 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 114 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් මඩකළපුව ප්‍රසිද්ධ නොතාරිස් වී. කනගරත්නම් යන අය විසින් ලියා සහතික කරන ලද 2013 සැප්තැම්බර් 25 දාතම හා අංක 6948 දරන 2015 නොවැම්බර් 21 දාතම හා අංක 8989 දරන 2012 ජනවාරි මස 02 දාතම හා අංක 5368 දරන සහ 2015 නොවැම්බර් මස 21 දාතම හා අංක 8991 දරන උකස් බැඳුම්කර සියල්ල මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සන්තිරපිල්ලෙයි සූතාකරන් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර ඇති හෙයින්ද

එහි අංක 6948, 8989, 5368 සහ 8991 දරන බැඳුම්කර ප්‍රකාර අයවියයුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් හැත්තෑ පන් ලක්ෂ අනූ හත් දහස් දෙසිය හතලිස් හතයි ශත පහක (රු. 7,597,247.05) මුදලක් 2018 අප්‍රේල් මස 07 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් හැත්තෑ පන් ලක්ෂ අනූ හත් දහස් දෙසිය හතලිස් හතයි ශත පහක (රු. 7,597,247.05) මුදල ද, 2018 අප්‍රේල් මස 08 වැනි දින සිට අංක 6948, 8989, 5368 සහ 8991 දරන එකී බැඳුම්කරය මත අයවියයුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැත්තෑ හතර ලක්ෂ හාර දහස් තුන්සිය අනූ හතයි ශත හතක (රු.7,404,397.07) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහයයි දශම පහක් (10.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා ද අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 6948, 8989, 5368 සහ 8991 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

1. නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරුවිල් පත්තුවේ, පඩ්ඩිරුප්පු ග්‍රාමයේ පිහිටි ලොට් අංක 05 වශයෙන් නිරූපිත "පඩ්ඩිරුප්පු වලව්" කියනු ලබන ඉඩම් කොටසට මායිම්, නැගෙනහිර සහ බස්නාහිරට : විකුණුම් කරුගේ ඉතිරි ඉඩම, දකුණට : ප්‍රධාන පාර, උතුරට : සුබ්‍රමනියම් ගේ අනෙක් කොටස සහ ප්‍රමාණයෙන් උතුර සිට දකුණට අඩි 78 නැගෙනහිර සිට බස්නාහිරට උතුරු පසින් අඩි 16 1/2, දකුණු පසින් අඩි 16 1/2 යන මායිම් තුළ පිහිටි ඉඩම් කොටස එහි අඩංගු සැම සියළු දේද සියළුම අයිතීන් ද සමග H 155/209 යටතේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන ඒ.ඊ.කේ. තිස්සේවේරසිංහ යන අය විසින් සාදන ලද 2012 මාර්තු මස 17 දාතම හා අංක 415/2012 දරන පිඹුරේ නිරූපිත ඉහත උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම පහත සඳහන් පරිදිය.

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරුවිල් පත්තුවේ, මංමුනායි දකුණ ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ, එරුවිල් පත්තු සහ මංමුනායි දකුණ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පඩ්ඩිරුප්පු ග්‍රාමයේ පිහිටි බලයලත් මානක තැන ඒ.ඊ.කේ. තිස්සේවේරසිංහ යන අය විසින් සාදන ලද 2012 මාර්තු මස 17 දාතම හා අංක 415/2012 දරන පිඹුරේ නිරූපිත "පඩ්ඩිරුප්පු වලව්" කියනු ලබන ඉඩම් කොටසට මායිම් : උතුරට : සුබ්‍රමනියම් සහ වෙනත් අයගේ වත්ත, නැගෙනහිරට : වී. බාල සුබ්‍රමනියම් යන අයගේ වත්ත, දකුණට : පඩ්ඩිරුප්පු පාර සහ බස්නාහිරට : වී. බාලසුබ්‍රමනියම් යන අයගේ වත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0106 හෝ පර්චස් හතරයි දශම එකයි නමයක් (A:0, R:0, P:4.19) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සාප්පු ගොඩනැගිල්ල සහ එහි අඩංගු සැම සියළු අයිතීන් ද සමගය. මෙම දේපළ පඩ්ඩිරුප්පු G.S.O. කොට්ඨාසයේ පිහිටා ඇත.

උකස්කරු බැඳුම්කර අංක 6948 සහ 8989 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.

2. නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, මංමුනායි පත්තුවේ, මංමුනායි උතුර ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ, මඩකලපුව මහ නගර සභා සීමාවන් තුළ වෝඩ් අංක 08 කොඩ්ඩායිමුනායි ග්‍රාමයේ බාර් පාරේ පිහිටි වරිපනම් අංක 364/20 දරන බලයලත් මානක තැන ඒ.ඊ.කේ. තිස්සේවේරසිංහ යන අය විසින් සාදන ලද 2015 මැයි 11 දාතම හා අංක 503/2015 නිරූපිත (බලයලත් මානක තැන ඒ. සිංගරාජා යන අය විසින් සාදන 2011 අප්‍රේල් මස 10 දාතම හා අංක AS/11/MN/72 දරන පිඹුරේ නිරූපිත) ඉඩම් කොටසට මායිම්, උතුරට : මනොරංජිතම් යන අයගේ වත්ත, නැගෙනහිරට : එන්. ප්‍රේමිලාතේවි යන අයගේ වත්ත දකුණට : අංක 96/2003 දරන පිඹුරේ ලොට් 06 සහ 08 සහ බස්නාහිරට : අංක 96/2003 දරන පිඹුරේ ලොට් 08 සහ බාර් පාර වෙත දිවෙන 3.0m පළල පටුමග යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0180 හෝ පර්චස් බිංදුවයි හතයි දශම එකයි බිංදුවක් (A:0, R:0, P: 07.10) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සැම සියළු දේ ගොඩනැගිල්ල, ළිඳේ කොටස සහ එහි අඩංගු සැම සියළු අයිතීන්ද සමගය. මඩකලපුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක B 675/168 යටතේ ලියාපදිංචි කොට ඇත.

උකස් බැඳුම්කර අංක 5368 සහ 8991 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

06 - 894/2

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ සංශෝධිත 4 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාවයි

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් වර්ෂ 2018 ක් වූ මැයි මස 22 වැනි දින පැවැත්වූ රුස්වීමකදී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

"නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. ජී. දිසානායක විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2015.12.02 දිනැති අංක 1051 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සිය ලියාපදිංචි කාර්යාලය අංගොඩ පිහිටි 2007 අංක 7 දරන සමාගම් පනත

යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වන නිව් ජයන්ත සෝ මිල්ස් ඇන්ඩ් ටිම්බර් ස්ටෝර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ අංගොඩ පදිංචි තනූජා නිරෝෂනි ලියනගේ (ණයට ගන්නන්) විසින් පැහැර හැර ඇති හෙයින් ද සහ ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එස්. ද සේරම් (මහත්මිය) විසින් ලියා සහතික කරන ලද 2015.12.17 දිනැති අංක 423 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දෙදෙනාම හෙයියන්තුඩුවේ පදිංචි තනූජා නිරෝෂනි ලියනගේ සහ හෙනරත් මොහොට්ටිගේ ඉෂන්ත පෙරේරා (ණයට ගන්නන්) විසින් පැහැර හැර ඇති හෙයින් ද,

තව ද තනූජා නිරෝෂනි ලියනගේ විසින් පහත උපලේඛනයේ විස්තර කරන දේපළ සහ පරිශ්‍රය සඳහා වන සිය නිදහස් අයිතිවාසිකම් හිමිකම් සහ බලපුළුවන්කාරකම් එකී, අංක 1051 සහ අංක 423 දරන උකස් බැඳුම්කරයන් යටතේ බැංකුවට උකස්කර ඇති හෙයින් ද,

තව ද වර්ෂ 2018 අප්‍රේල් මස 30 වැනි දිනට එකී අංක 1051 සහ අංක 423 දරන උකස් බැඳුම්කරයන් යටතේ බැංකුවට රුපියල් දහඅට මිලියන හාර ලක්ෂ පනස් දෙදහස් විසි එකයි ශත පනස් දෙකක (රු. 18,451,021.52) මුදලක් අයවිය යුතුව හා ණයව පවතින බැවින් ද,

සංශෝධනය කරන ලද 1990 අංක 04 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත (ප්‍රධාන පනත) යටතේ බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇති බලතලවලට අනුව එකී රුපියල් දහඅට මිලියන හාර ලක්ෂ පනස් දෙදහස් විසි එකයි ශත පනස් දෙකක (රු. 18,451,021.52) මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද වර්ෂ 2018 මැයි මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා පහත සඳහන් මුදල් මත පහත සඳහන් අනුපාතිකයන් යටතේ පොළිය ද, ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම් ද, ප්‍රධාන පනතේ 4 වැනි වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එය ද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී අංක 1051 සහ අංක 423 දරන බැඳුම්කරයන් යටතේ බැංකුවට උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට ප්‍රධාන පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතලවලට අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.

(i) එකී අංක 1051 දරන බැඳුම්කරය මගින් සුරැකුම් කරන ලද එකී අංක 1051 දරන බැඳුම්කරය යටතේ බැංකුවට හිඟව පවතින මුදල වන රුපියල් හය මිලියන පන් ලක්ෂ දසදහසක (රු. 6,510,000.00) මුදල මත වසරකට 12.25%ක පොළිය ද,

(ii) එකී අංක 423 දරන බැඳුම්කරය මගින් සුරැකුම් කරන ලද සහ එකී අංක 423 දරන බැඳුම්කරය යටතේ බැංකුවට හිඟව පවතින මුදල වන රුපියල් දසමිලියන අටලක්ෂ දාහත් දහස් හාරසිය තුනයි ශත හයක (රු. 10,817,403.06) මුදල මත වසරකට 13%ක පොළිය ද වේ."

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ වූ බියගම කොට්ඨාස ලේකම් කාර්යාලය තුළ වූ හෙයියන්තුඩුව-නැගෙනහිර ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසය තුළ වූ හෙයියන්තුඩුව ගමෙහි පිහිටි ගොරකගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙහි බලයලත් මානක ඒ. රත්නම් විසින් සාදන ලද 2004.06.16 දිනැති අංක 499/4 දරන පිඹුරෙහි ලොට් B ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස (බලයලත් මානක ඩී. සී. කොතලාවල විසින් සාදන ලද 1988.07.03 දිනැති පිඹුරු අංක 112/88 හි නැවත මැනීමක් සහ ඒකාබද්ධ කිරීමක් වන) වන අතර එකී ලොට් B උතුරු-නැගෙනහිරට පිඹුරු අංක 112/88 හි ලොට් 5න් ද, දකුණු-නැගෙනහිරට පිඹුරු අංක 112/88හි ලොට් 3න් සහ සංඝමිත්තා විද්‍යාලය පරිශ්‍රයෙන් ද, දකුණු-බටහිරට : කොට්ටුන්න පාරෙන් ද සහ උතුරු-බටහිරට : ලොට් A වලින් ද මායිම් වන අතර ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසිතුනයි දශම නවයයි හතක් (අ. 0, රූ. 1, පර්. 23.97) වන අතර එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ අනෙකුත් සියලු දේද සමග වන අතර සහ/හෝ එකී පරිශ්‍රයට ස්ථිරවම සවිකර ඇති දේවල් ද ඇතුළුව වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N 229/61හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

සමාගම් ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

06 - 899

---

### නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ (සංශෝධිත) 4 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2018ක් වූ මැයි මස 22 වැනි දින පැවැත්වූ රැස්වීමක දී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

" කැළණිය දරන ස්ථානයේ පදිංචි සවුන්දර හෙන්නැදිගේ සනත් ප්‍රියන්ත සිල්වා (ණයට ගන්නා) යන අය වෙත ප්‍රදානය කරන ලද ණය මුදල්/මූල්‍ය පහසුකම් වෙනුවෙන් සුරැකුම් ලෙස ප්‍රසිද්ධ නොතාරිස් ජනගන් අමලෙයි (මෙනවිය) විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2017.12.15 දිනැති අංක 254 දරන උකස් බැඳුම්කරය මගින් නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) වෙත උකස් කොට සහ උකස් කරන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් හොඳින් විස්තර කර ඇති දේපල සහ

පරිශ්‍රය සම්බන්ධයෙන් වූ උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම ණයට ගන්නා විසින් පැහැර හැර ඇති හෙයින් ද,

තවද එකී සවුන්දර හෙන්නැදිගේ සනත් ප්‍රියන්ත සිල්වා විසින් පහත උපලේඛනයේ විස්තර කරන දේපල සහ පරිශ්‍රය සඳහා වන සිය නිදහස් අයිතිවාසිකම්, හිමිකම් සහ බලපුළුවන්කාරකම් එකී උකස් බැඳුම්කරය යටතේ බැංකුවට උකස්කර ඇති හෙයින් ද,

තවද වර්ෂ 2018 අප්‍රේල් මස 30 වැනි දිනට එකී බැඳුම්කරය යටතේ බැංකුවට රුපියල් අට මිලියන තුන් ලක්ෂ පනස් පන් දහස් එකසිය හතලිස් හතරයි ශත විසි අටක (රු. 8,355,144.28) මුදලක් අයවිය යුතුව හා ණයව පවතින බැවින් ද,

සංශෝධනය කරන ලද 1990 අංක 4 දරන බැංකු මගින් ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත (ප්‍රධාන පනත) යටතේ බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇති බලතල වලට අනුව එකී රුපියල් අට මිලියන තුන් ලක්ෂ පනස් පන් දහස් එකසිය හතලිස් හතරයි ශත විසි අටක (රු. 8,355,144.28) මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක්ද වර්ෂ 2018 මැයි මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා එකී අංක 254 දරන බැඳුම්කරය මඟින් සුරැකුම් කරන ලද සහ එකී අංක 254 දරන බැඳුම්කරය යටතේ බැංකුවට හිඟව පවතින මුදල වන රුපියල් හය මිලියන අට ලක්ෂ පනස් හතර දහසක (රු. 6,854,000.00) මුදල මත වසරකට සියයට දහ අට (18%) පොළියද ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම්ද, ප්‍රධාන පනතේ 13 වැනි වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම්ද මෙතැන් සිට ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එයද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී බැඳුම්කරය මගින් බැංකුවට උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන පී. කේ. ඊ. සේනාපති විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට ප්‍රධාන පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතල වලට අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ."

**ඉහත සඳහන් උකස්කර ඇති දේපල පිළිබඳ විස්තරය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ, අදිකාරි පත්තුවේ, කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ, කැලණිය (264) ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කැලණිය ගමෙහි පිහිටි "මීගහවත්ත හෙවත් මෙස්ට්විගේවත්ත" නැමති ඉඩමට අවසරලත් මානක ලෙස්ලි එන්. ප්‍රනාන්දු මහතා විසින් 2017.05.24 වැනි දින මැන සකස් කළ අංක 8177 දරන පිඹුරේ ලොට් 25A ඉඩමට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 26 ද, නැගෙනහිරට : වලව් වත්ත පාර (එම ඉඩමේ ලොට් C) ද, දකුණට : එම ඉඩමේ ලොට් 24 සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 18 ද යන මායිම් තුළ ඉහත කී පිඹුරු අංක 8177 පරිදි පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) ඉඩම ඉහත කී අවසරලත් මානක ලෙස්ලි එන්. ප්‍රනාන්දු මහතා විසින් 2017.05.24 දින මැන සකස් කළ අංක 8177 දරන පිඹුරේ ලොට් 25A දරණ ඉඩම පහත වැඩිදුරටත් විස්තර කරනු ලබන ඉඩමේ නැවත බෙදීමක් වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ, අදිකාරි පත්තුවේ, කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයසහ ප්‍රාදේශීය සභා සීමාව තුළ, කැලණිය (264) ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කැලණිය ගමෙහි පිහිටි "මීගහවත්ත හෙවත් මෙස්ට්විගේවත්ත" නැමති ඉඩමට අවසරලත් මානක එන්.එස්. සිරිසේන මහතා විසින් 1970.04.10 වැනි දින මැන සකස් කළ අංක 400 දරන පිඹුරේ ලොට් 25 ඉඩමට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 26 ද, නැගෙනහිරට : පිඹුරු අංක 370 හි ලොට් C ද, දකුණට : ලොට් 24 සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 18 ද යන මායිම් තුළ ඉහත කී පිඹුරු අංක 400 පරිදි පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) ඉඩම සහ මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 198/32 හි ලියාපදිංචි වී ඇත.

ඉහත කී ඉඩම මත ස්ථිර ලෙසම සවි කර ඇති හෝ තබා ඇති සහ කළින් කළ ගෙන එනු ලබන සෑම සහ සියළු ආකාරයකම නිශ්චල යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ, සවිකිරීම්, ඇමුණුම් සහ සේවා ද සමග වන අතර විදුලිය සැපයීමේ පද්ධති සහ උපකරණ, ජලය සැපයීමේ පද්ධති සහ උපකරණ, විදුලි සංදේශ උපකරණ සහ වායුසමීකරණ උපකරණ ද සමග වේ.

අධ්‍යක්ෂක මණ්ඩල නියෝගය පරිදි,

සමාගම් ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

06 - 900

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ සංශෝධිත 4 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2018 ක් වූ මැයි මස 22 වැනි දින පැවැත්වූ රැස්වීමකදී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

"නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. කේ. වික්‍රමනායක විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2016.09.23 දිනැති අංක 2159 සහ වර්ෂ 2016.09.23 දිනැති අංක 2161 දරන උකස් බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සිය ලියාපදිංචි කාර්යාලය කොළඹ 06, මූර් පාර, අංක 50 දරන ස්ථානයේ පිහිටි 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි අංක PV 103204 දරන යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වන සීපරා ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ් (ණයට ගන්නා) විසින් පැහැර හැර ඇති හෙයින් ද,

තව ද සීපරා ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පහත උපලේඛනයේ විස්තර කරන දේපළ සහ පරිශ්‍රය සඳහා වන සිය නිදහස් අයිතිවාසිකම් හිමිකම් සහ බලපුළුවන්කාරකම් ඉහත, අංක 2159 සහ 2161 දරන උකස් බැඳුම්කරයන් යටතේ බැංකුවට උකස්කර ඇති හෙයින් ද,

තව ද වර්ෂ 2018 අප්‍රේල් මස 30 වැනි දිනට 2159 සහ 2161 දරන උකස් බැඳුම්කරයන් යටතේ බැංකුවට රුපියල් හතළිස් හත් මිලියන නව ලක්ෂ අනූ එක් දහස් අසූ තුනයි ශත හැට එකක (රු. 47,991,082.61) මුදලක් අයවිය යුතුව හා ණයව පවතින බැවින් ද,

සංශෝධනය කරන ලද 1990 අංක 04 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත (ප්‍රධාන පනත) යටතේ බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇති බලතලවලට අනුව එකී රුපියල් හතළිස් හත් මිලියන නව ලක්ෂ අනූ එක් දහස් අසූ තුනයි ශත හැට එකක (රු. 47,991,082.61) මුදල සහ විකිණීම කරන අවසථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද වර්ෂ 2018 මැයි මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා -

(i) එකී අංක 2159 දරන බැඳුම්කරය මගින් සුරකුම් කරන ලද අංක 2159 දරන බැඳුම්කරය යටතේ බැංකුවට හිඟව පවතින මුදල වන රුපියල් විසි එක් මිලියන තුන් ලක්ෂ දහදහස් අටසිය පනස් හයක (රු. 21,310,856.00) මුදල මත වසරකට සියයට දහසයයි දශම හතයි පහක (16.75%) පොළිය ද,

(ii) එකී අංක 2161 දරන බැඳුම්කරය මගින් සුරකුම් කරන ලද සහ එකී අංක 2161 දරන බැඳුම්කරය යටතේ බැංකුවට හිඟව පවතින මුදල වන රුපියල් මිලියන පහක (රු. 5,000,000.00) මුදල මත වසරකට සියයට දහසයයි දශම හතයි පහක (16.75%) පොළිය ද,

(iii) එකී අංක 2161 දරන බැඳුම්කරය මගින් සුරකුම් කරන ලද සහ එකී අංක 2161 දරන බැඳුම්කරයන් යටතේ බැංකුවට හිඟව පවතින මුදල වන රුපියල් මිලියන විස්සක (රු. 20,000,000.00) මුදල මත වසරකට සියයට දහසයයි දශම හතයි පහක (16.75%) පොළිය ද,

ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම් ද, ප්‍රධාන පනතේ 13 වැනි වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) එය ද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී එකී බැඳුම්කරය යටතේ බැංකුවට උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට ප්‍රධාන පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතලවලට අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.

**උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය**

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගිනිගොඩ කෝරළේ, මැදදමැඩිලියා පත්තු, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 10A බතබුරේ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ බතබුරේ ග්‍රාමයෙහි බලයලත් මානක H. M. R. T. K. හේරත් විසින් මැන සාදන ලද වර්ෂ 2015.09.21 දිනැති පිඹුරු අංක 320/07/2013 දරන පිඹුර ප්‍රකාර කැබලි 01 ලෙස හඳුන්වනු ලබන ගල්ලෙනද වත්ත, ගල්ගොඩහේන සහ කැටකළහේන ගහමුලවත්ත දරන ඉඩම් කැබැල්ලට මායිම්ව, උතුරට : අන්දිරාමාතු සිට බතමුරේට දිවෙන ප්‍රාදේශීය සභා පාර, ගල්ගොඩහේන, පිඹුරු අංක 320/1/2013හි ලොට් 01, පිඹුරු අංක 320/2/2013හි ලොට් අංක 1, පිඹුරු අංක 320/3/2013හි ලොට් 01, පිඹුරු අංක 320/04/2013හි ලොට් 2, නැගෙනහිරට : රඹුක්කන සිට කෑගල්ල කැටකළ ගහමුල්ලවත්ත දක්වා දිවෙන මහා මාර්ගය, දකුණ : ඔවත්තගම ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගණය, කැටගහමුල්ලවත්ත සහ බටහිර : ගල්ලෙන්ද වත්ත සහ පිඹුරු අංක 320/03/2013හි ලොට් 02, ඉඩම් කැබලි ද මායිම් තුළ 1, පිඹුරු අංක 320/07/2013 අනුන ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් එකයි පර්චස් එකොළහයි දශම පහයි හතක (අ. 1, රූ. 1, පර්. 11.57) විශාල ඉඩම තුළ ඇති ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදි සියලු දේද වේ. මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක 139/80 යටතේ ලියාපදිංචි කර ඇත.

